# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,922 — 1970 සැප්තැම්බර් 4 වැනි සිකුරාදා — 1970.9.4

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1267 | තොටුපළ ෆෙරන්ද හා වෙනත් ෆෙරන්ද විකිණීම ... ... | 1293 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1278 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1282 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | 1294 |
| මඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1291 | විවිධ දැන්වීම ... ... ... ... | 1294 |


සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශක වරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන්කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 6ක රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙපොත් යටතේ ගෙවීමත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී මුළුව ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන්ද දෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවයේ සිටින්නන්ට හැර සෙසු අයට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යන්න පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙසේ ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

පත් කරනු ලබන මණ්ඩලයක් මඟින් එම ප්‍රසිද්ධ කරනු ලබන නිර්මාණයන්ගේ වටිනාකම විනිශ්චය කිරීමෙන් අනතුරුව රු. 7,800 ආරම්භක වැටුපෙහි ඔහු තබනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියකු බව,

(ඇ) 1970.9.18 වැනි දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි බව. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙහි උපරිම වයස් සීමාව බල නොපානු ඇත),

(ඈ) පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවන හෝ දෙවන පංතියේ ගෞරව සාමාර්ථයක් සහිතව භූ භෞතික විද්‍යාවෙන් විද්‍යාවේදී (විශේෂ) උපාධිධරයකු බව.

**පුහුණුව ලබන භූ භෞතික විද්‍යාඥ**

5. **සුදුසුකම්, සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි, දීමනා, සේවා කොන්දේසි.**—

(i) භූ භෞතික විද්‍යාඥ ලෙස පත් කිරීම පිණිස 4 වැනි ඡේදයේ ඇතුලත් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් නොවුවහොත් පහත සඳහන් සුදුසුකම්වලින් යුත් අයදුම්කරුවන් පුහුණුව ලබන භූ භෞතික විද්‍යාඥ ලෙස තෝරා ගැනීම සඳහා සලකා බලනු ඇත. භූ භෞතික විද්‍යාඥ තනතුරුවලට පත් කිරීමට පෙරාතුව ඔවුහු පළමුවන හෝ දෙවන පංතියේ ගෞරව සහිතව භූ භෞතික විද්‍යාවෙන් විද්‍යාවේදී (විශේෂ) උපාධිය ලබාගත යුත්තාහ.

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවන හෝ දෙවැනි ගෞරව සහිතව භෞතික විද්‍යාවෙන් විද්‍යාවේදී (විශේෂ) උපාධිය.

(ආ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් ඇති යටත් පිරිසෙයින් දෙපාර්තමේන්තුවේ දැ අවුරුද්දක සේවාවක් ඇති භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ද "පුහුණුව ලබන භූ භෞතික විද්‍යාඥ" තනතුරට පත් කිරීම පිණිස සලකා බැලීම සඳහා සුදුස්සන් වේ :—

(i) ගණිතය හා භෞතික විද්‍යාව සහිතව විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය.

(ඇ) 1970.9.18 වැනි දිනට වයස අවුරුදු 19ට නොඅඩු සහ අවුරුදු 26ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් කෙරෙහි උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

(ii) බී.එස්සී (සාමාන්‍ය) උපාධියක් සහිතව කෙළින් බඳවා ගන්නා අයට පුහුණුවන කාලය තුළදී රු. 6,456ක ඒකාබද්ධ වාර්ෂික වැටුපක් සහ විවාහකයෙකු නම් විවාහක දීමනාවද ගෙවනු ඇත. පුහුණුව ලබන භූ භෞතික විද්‍යාඥයන් ලෙස තෝරාගනු ලබන භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඔවුන්ගේ ස්ථිර තනතුරේ වැටුප් පරිමාණයම පුහුණුව ලබන කාලය තුළදී ලබනු ඇත. පුහුණුව සාර්ථක අන්දමින් නිම කිරීමෙන් පසු, එනම් භූ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක් සහ භූ භෞතික විද්‍යාඥ ලෙස පත් වීම ලැබූ පසු ඔවුහු 3 වැනි ඡේදයේ සඳහන් වැටුප් පරිමාණය ලබනු ඇත.

(iii) පුහුණුව ලබන භූ භෞතික විද්‍යාඥ තැන භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේදී පුහුණුවීමේ පාඨ මාලාවක් හදාරනු ඇත. ඔහුගේ වැඩ සහ පැවැත්ම සතුටුදායක වුවහොත් විශ්ව විද්‍යාලයක භූ භෞතික විද්‍යා පුහුණුව සඳහා ඔහු යවනු ලැබේ. දෙපාර්තමේන්තුවේ පුහුණුව ලබන කාලය තුළ, වැඩ සහ පැවැත්ම අසතුටුදායකවනු ලබන හෝ ඔහු සඳහා පිළියෙළ කර දෙනු ලබන පාඨමාලාව පිළි නොගන්නා පුහුණුවන්නකු වෙතොත් කලින් දැනුම් දීමක් නොමැතිව ඔහුගේ සේවය නවත්වනු ලැබේ. දෙපාර්තමේන්තුවේ ඔහුගේ පුහුණුව වෙනුවෙන් වූ සම්පූර්ණ වියදම් ආපසු ආණ්ඩුවට ගෙවීමට ඔහුට සිදුවනු ඇත.

(iv) තෝරාගනු ලබන අපේක්ෂකයා පත් කිරීමට පෙර හෝ පසුව පිටරට ගොස් පුහුණුවීමේ පාඨමාලාවක් හදාරන ලෙස ඔහුට නියම කරනු ලැබිය හැකි අතර, ඒ පුහුණුවීමේ කාල පරිච්ඡේදය තුලදී, එකලට බලපවත්වන ව්‍යවස්ථාවන්ට අනුව සුදුසු දීමනා ගෙවනු ලැබේ. තෝරා ගනු ලබන අපේක්ෂකයාට පිටරට ගොස් පුහුණුවීමේ පාඨමාලාවක් හදාරන ලෙස නියම කරනු ලැබුවහොත්, අනිකුත් කරුණු අතර පහත සඳහන් පරිදි පොරොන්දු වෙමින් ලංකාණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වන ලෙස (රජයේ සේවයෙහි නොවන අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම්, ඇපකරුවන් දෙදෙනෙකු ඇතුව බැඳුම්කරයකට ඇතුළත්වන ලෙස) ඔහුට නියම කරනු ලැබේ. ඒ පොරොන්දු නම් :—

(අ) නියමිත පුහුණුවීමේ පාඨමාලාව අවංකවත් උදෙන්ගිමත් ලෙසත් හදාරා එය සතුටුදායක ලෙස සම්පූර්ණ කරන බවට සහ පුහුණුවීමේ පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු නියමිත කාල පරිච්ඡේදයක් තුළ ලංකාණ්ඩුවේ සේවය කරන ලෙස නියම කරනු ලැබුවහොත් (කාල පරිච්ඡේදය රජය විසින් තීරණය කරනු ලබනු ඇත.) එසේ සේවය කරන බවට ; සහ

(ආ) ගිවිසුමේ සහ/හෝ බැඳුම්කරයේ නියමයන් හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීමට තමා අපොහොසත් වුවහොත් ලංකාණ්ඩුව හෝ ශිෂ්‍යත්ව ප්‍රදාන ඒජන්සිය හෝ විසින් මුළු පුහුණුවීමේ පාඨමාලාව වෙනුවෙන් දරන ලද සියළුම වියපැහැදම් (එනම්—වැටුප්, දීමනා යාත ගාස්තු ආදිය) ලංකාණ්ඩුවට ආපසු ගෙවන බවටද වේ.

6. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුයි :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැලකිය යුතුයි.**—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

7. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

8. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

10. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින් නාමුදු ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාමුද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අගෝස්තු මස 28 වැනිදා,
කොළඹ 1, යෝර්ක් වීදියේ මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදිය,
තැ. පෙ. 500.

9–230/2—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## කම්කරු දෙපාර්තමේන්තුව

### සැලසුම්කරුගේ තනතුර

කම්කරු දෙපාර්තමේන්තුවේ සැලසුම්කරුගේ තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කළ අයදුම් පත්‍ර 1970 සැප්තැම්බර් මස 28 වන දින හෝ ඊට පෙර කොළඹ 5, කම්කරු මහලේකම් කාර්යාලයේ, කම්කරු කොමසාරිස් වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

2. සේවා කොන්දේසි.—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අයකර ගනු ලැබේ.

3. වැටුප්.—මෙම තනතුරට රු. 1,260—120—රු. 3,780 ක වාර්ෂික වැටුප් ක්‍රමයක් හිමිය. රු. 2,820 වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ. (ඒකාබද්ධ වැටුප රු. 3,432—144—6,456 වේ.)

සටහන 1.—තෝරා ගන්නා ලද අයදුම්කරු, ඔහුගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව මෙවැනි අනුග්‍රහයක් ලැබීමට සුදුසුයයි හැඟෙන්නේ නම්, සැලසුම්කරුවන් සම්බන්ධ අන්තර් දෙපාර්තමේන්තු උපදේශක සභාවෙන් විමසීමෙන් සහ භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතුව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට වඩා උසස් වැටුපක තැබීමට ඉඩ ඇත.

4. අවශ්‍ය සුදුසුකම්.—

(ඒ) 1970 සැප්තැම්බර් 28 දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 25ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ නිලධාරීන්ට මෙම වයස් සීමාව බල නොපවත්වනු ඇත.

(බී) විශිෂ්ඨ චරිතයක් හා හොඳ ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

(සී) රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක යාන්ත්‍රික ඉංජිනේරු සැලසුම්කරුවෙකු ලෙස අඩු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් තිබීම.

හෝ

(ඩී) පිළිගත් සැලසුම් කාර්යාලයක හෝ කර්මාන්ත ශාලාවක හෝ අවුරුදු 3 ක් පමණ ආධුනිකයෙකු වශයෙන් පුහුණුව ලබා තිබීම සහ යාන්ත්‍රික ඉංජිනේරු සැලසුම්කරුවෙකු ලෙස අඩු වශයෙන් අවුරුදු පළපුරුද්දක් ලබා තිබීම.

සටහන 1.—ඉහත සඳහන් සුදුසුකම් වලට අමතරව පහත දැක්වෙන සුදුසුකම් වලින් එකක් හෝ වැඩි ගණනක් ඇති අයදුම්කරුවන්ට විශේෂ සැලකිල්ලක් දක්වනවා ඇත.

(i) සුළු සැලැස්මවල් ඇඳීම සහ යන්ත්‍ර කොටස් උපකරණ නොමැතිව කටුසටහන් ඇඳීමේ පළපුරුද්ද.

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨමාලාවෙන් සමත් වී තිබීම.

(iii) ලංකා කාර්මික විද්‍යාලයේ සන්ධ්‍යා යාන්ත්‍රික ඉංජිනේරු පාඨමාලාවෙන් සමත්වී තිබීම.

(iv) ලංකා කාර්මික විද්‍යාලයේ සැලසුම්කරුවන්ගේ පාඨමාලාවෙන් සමත්වී තිබීම.

(v) පිළිගත් වෙනත් කාර්මික සුදුසුකම්.

5. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම් පත් සමග මෙහි සඳහන් සහතිකවල පිටපත් පමණක් ඇමිණිය යුතුයි.

(ඒ) උප්පැන්න සහතිකය.

(බී) අධ්‍යාපන සහ කාර්මික සුදුසුකම් දැක්වෙන සහතික.

(සී) මෑතකදී ලබාගන්නා ලද චරිත සහතික දෙකක් (රජයේ සේවයේ නියුතු නිලධාරීන්ට මෙය අදාල නොවේ.)

6. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

7. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. මෙහි 5 වන ඡේදයේ සඳහන් කොන්දේසිවලට පටහැනිව එවන ලද සහතික පත්වල මුල් පිටපත් ආපසු එවනු නොලැබේ.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

1970 අගෝස්තු මස 26 වන දින,
කොළඹ 5, කම්කරු දෙපාර්තමේන්තුවේදිය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :—
   (ඒ) වාසගම :————.
   (බී) අනෙක් නම් :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)
   (ඒ) 1970 සැප්තැම්බර් මස 28 දිනට වයස :
   අවුරුදු :——, මාස :——, දින :——.

4. පුරවැසි භාවය හා එය ලබාගත් අන්දම :————.
   පහත සඳහන් අය උපන් ස්ථානය සඳහන් කරන්න :—
   (ඒ) අයදුම්කරු :————.
   (බී) අයදුම්කරුගේ පියා :————.
   (සී) පිය පාර්ශ්වයේ මුත්තා :————.
   (ඩී) පිය පාර්ශ්වයේ මී මුත්තා :————.
   (අයදුම්කරු ලංකාවේ උපන්නේ නම් (ඒ) හැරුනු විට (බී) හෝ (සී) සහ (ඩී) හෝ සම්පූර්ණ කළ යුතුයි. අයදුම්කරු ලංකාවේ උපත ලැබුවේ නැතිනම් (ඒ) හැරුනු විට (බී) සහ (සී) හෝ (සී) සහ (ඩී) හෝ සම්පූර්ණ කළ යුතුයි.)

5. විවාහකද නැද්ද යන වග :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. කාර්මික සුදුසුකම් :————.

8. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියාවල් :————.

9. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීමේ හෝ පළපුරුදුකම් :————.

10. ඔබේ චරිතය සහ දක්ෂතාවය ගැන සහතික කළහැකි අදදෙනෙකුගේ නම සහ ලිපිනයන් .————.

11. සහතික ලබාගත්තේ කාගෙන්ද :————.

මෙම අයදුම්පතෙහි ම විසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත් කරනු ලැබුවායින් පසු සොයා ගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–142—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### රජයේ ගුරු විද්‍යාලයයන්හි කෘෂිකර්ම අභ්‍යාසාචාර්ය තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශයේ, රජයේ ගුරු විද්‍යාලයයන්හි කෘෂිකර්ම අභ්‍යාසාචාර්ය තනතුරු (සිංහල හා දෙමළ මාධ්‍ය) සඳහා ඉල්ලුම් පත් එවන ලෙස-පුරුෂ පක්ෂයේ ඇයදුම්කරුවන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව පිළියෙල කරගත යුතු වූ ඇයදුම්පත්, 1970.9.18 වැනි දින හෝ ඊට පෙර, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් (ගුරු විද්‍යාල ශාඛාව) වෙත ලැබෙන සේ එවිය යුතුය.

සටහන්.—(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම සඳහා කරන ඉල්ලීම් භාරගත නො හැකිය. මෙම දැන්වීමේ දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව, අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රය පිටපත් කර ගත යුතුය.

(ii) යම්කිසි ඇයදුම්පතක් තැපැලේ දී නැති වී හෝ ප්‍රමාද වී හෝ ඇතැයි ඉදිරිපත් කරන කිසිම දෝෂාරෝපනයක් ගැන සලකා බැලිය නොහැක. ස්වකීය අයදුම් පත් එවීමට අවසාන දිනය තෙක් පමාවන අයදුම්කරුවන් විසින් එසේ පමාවීමෙන් සිදු වන පාඩුව විඳ දරා ගත යුතු ය.

(iii) අංක 14,870 හා 1969.9.5 දින දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අනුව ඉල්ලුම් කළ ඇයදුම්කරුවන් නැවත ඉල්ලුම් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—

(ඒ) පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් රෙගුලාසි යටතේ මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ, ගුරුවරුන් වශයෙන් විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරණ අයදුම්කරුවන් මෙම තනතුරු සඳහා තෝරාගනු ලැබුවහොත්, ඔවුන් මෙම තනතුරු දරණ තෙක්, තනතුරු විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ලැබේ.

(බී) තෝරා ගනු ලබන ඇයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ගුරු විද්‍යාලයකට පත් කර යැවීමට ඉඩ තිබේ.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය :—රු. 5,592—7 × 144, 8 × 180 සහ 2 × 240—රු. 8,520 වාර්ෂික.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම ඇයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව,

(බී) 1970.9.18 වැනි දිනට ඇයදුම්කරුවන් වයස අවුරුදු 25 ට අඩු හෝ අවුරුදු 50 ට වැඩි හෝ නොවිය යුතුයි. (රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදාල නොවේ.)

(සී) අයදුම්කරුවන් කෘෂිකර්මය පිළිබඳ උපාධිධාරීන් විය යුතු අතර, උපාධියෙන් පසු අවුරුදු 3ක ඉගැන්වීමේ පළපුරුද්දක් ලැබ සිටින්නන් විය යුතුය. නැතහොත් පුහුණුවීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 5ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති ද්විතියික පුහුණු (කෘෂිකර්ම) ගුරුවරුන් හෝ විශේෂඥ පුහුණු (කෘෂිකර්ම) ගුරුවරුන් විය යුතුය. ඔවුන්ට සිංහල/දෙමළ පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය.

5. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදල පොදු කොන්දේසි වලට ද අවධානය යොමු කරනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.8.21 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

**රජයේ ගුරු විද්‍යාලයයන්හි කෘෂිකර්ම අභ්‍යාසාචාර්ය තනතුරක් පිළිබඳ ඉල්ලුම් පත්‍රයයි**

1. (i) සම්පූර්ණ නම :————.
(ii) මුලකුරුත් සමග නම :————.

2. ලිපිනය :————.
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරි :————.

3. (i) 1970.9.18 වැනි දිනට නිවැරදි වයස :—
අවුරුදු :————., මාස :————., දින :————.
(ii) උපන් දිනය :————.

4. ජාතිය හා එය ලද අන්දම :————.

5. උපන් ස්ථානය :—
(අ) ඉල්ලුම්කරු :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
(ඉ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

6. ලබාගත් දින සමඟ අධ්‍යාපන සුදුසුකම් (ලබා තිබෙන අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :————.

7. වෘත්තීය සුදුසුකම් (ලබා තිබෙන වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :————.

8. ඉගෙනීම ලැබූ පාසල් හා විද්‍යාල (ඇතුළත් වූ සහ අස්වූ දින සඳහන් කළ යුතුය) :————.

9. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දක්වෙන පෝර්මයෙහි විස්තර සඳහන් කරන්න) :————.

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | ඇතුලත්වූ දිනය | අස්වූ දිනය | දරූ තනතුර | සේවා කාලය | | | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|---|---|
| | | | | අ. | මා. | දි. | |
| | | | | | | | |

10. සිංහල/දෙමළ පිළිබඳව ලබා තිබෙන සුදුසුකම් :————.

11. චරිත සහතික ලබාගත් අයගේ (ඥතීන් නොවේ) නම් හා නිලතල (සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය). රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය :————.

12. වෙනත් සුදුසුකම් :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත්, මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව තෝරා පත්කර ගැනීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුණ හොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහකර දමනු ලැබීමට යටත්වන බව ද දනිමි.

..............................,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

විදුහල්පතිගේ නිර්දේශය :————.

දිනය :————.

9–144—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි උපදේශක තනතුර සඳහා පුහුණුවන උපදේශකයින් බඳවා ගැනීම

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි උපදේශක තනතුරු සඳහා පුහුණුවන උපදේශකයින් බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ වූ ඉල්ලුම් පත්‍ර 1970.9.25 වැනි දිනට හෝ ඊට ප්‍රථම ස්ථිර ලේකම් තුමා (සාමාන්‍ය පරිපාලන ශාඛාව) අධ්‍යාපන අමාත්‍යාංශය, මැලේ වීදිය, කොළඹ 2 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

2. තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට මෙහි පහත පස්වැනි ඡේදයේ දක්වෙන වෘත්තීන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන්, රත්මලාන කණිෂ්ඨ කාර්මික ආයතනයේ තාවකාලික පිහිටුවනු ලබන (කටුබැද්දේ ස්ථිර කාර්මික ගුරු විද්‍යාලයක් පිහිටුවන තෙක්) ගුරුවරුන් පුහුණු කිරීමේ අංශයේ එක් අවුරුදු පුහුණුවක් දෙනු ලැබේ.

3. කාර්මික අධ්‍යාපන ආයතනයන්හි උදදේශක තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ස්ථිර උපදේශක තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය :—රුපියල් 6,024 වාර්ෂික ඒකාබද්ධ වැටුපෙන් පටන් ගෙන රු. 144 වාර්ෂික වැටුප් වැඩිවීම් 4කින් සහ රු. 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8කින් රු. 8,040 වාර්ෂික ඒකාබද්ධ වැටුප දක්වා වැඩි වේ.

සටහන.—මෙම වැටුප් ක්‍රමයට අනුරූපව 1969.9.30 වැනි දින දක්වා පැවති වැටුප් ක්‍රමය මෙසේය :—රුපියල් 3,420—වාර්ෂික මූලික වැටුපෙන් පටන්ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 4කින් සහ රුපියල් 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8කින් රු. 5,340 වාර්ෂික වැටුප දක්වා වැඩි වේ.

4. පුහුණු කිරීම සඳහා බඳවා ගනු ලබන අයදුම්කරුවන්ට තිබිය යුතු අධ්‍යාපනික, වෘත්තීය හා වෙනත් සුදුසුකම් මෙසේය :—

(i) 1970.9.25 වැනි දිනට වයස අවුරුදු 19 ට නො අඩු සහ අවුරුදු 35 ට නො වැඩි විය යුතුය.

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව ;

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ

(ආ) දෙකකට නො වැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා අංක ගණිතය/ගණිතය ඇතුළු විෂයයන් 6කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් හෝ

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත්වූ විභාගය, දිනයන් සමග :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————.

9. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේද ?

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————.

10. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර (අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න :————.

11. විශේෂ සුදුසුකම්—
(නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පල පුරුද්ද ඔබට තිබේද ? එසේනම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින, වකවානු සහිතව සඳහන් කරන්න) :————.

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබේද ? එසේනම් (අ) දිනය (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේනම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නොකළයුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත) :————.

16. සේවා මුක්ත භටයෙක් නම්. (අ) සේනාංකය. (ආ) නිලය. (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරණලද දින පිළිබඳ විස්තර :————.

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා—

(i) ආයතනවල නම් :————.

(ii) දරණලද තනතුර :————,

(iii) නියුක්තව සිටි දින වකවානුව :————,

(iv) අස්වීමට හේතුව :————.

(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව—

(i) ආයතනයේ නම :————.

(ii) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත්වූ දිනය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියමද ? :————.

(iv) (දීමනා රහිතව) දැනට ලබන වාර්ෂික වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(ඒකාබද්ධ වැටුප් ලබන්නේ නම් දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප හා වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය සඳහන් කරන්න.)

(v) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

(vi) දැනට නියුක්ත තනතුරේ සේවය ස්ථිර කර තිබේද යනවග : ————.

(සේවය ස්ථිර කර තිබෙනම් එම ලිපියේ පිටපතක් අමුණන්න)

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරනලද විස්තර, සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම් කරුගේ අත්සන.

දිනය :————.

9–170—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ " ඒ " ජාඇල-දඹුගම් පේරුවේ හදිසි මරණ පරීක්ෂක ධුරය

කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ " ඒ " ජාඇල-දඹුගම් පේරුවේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කරමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරණ ලද අයදුම්පත් 1970 ඔක්තෝබර් 10 වැනි දිනට පෙර ජා-ඇල දකුණු අළුත්කුරු කෝරළේ " ඒ " ප්‍රාදේශීය ආදායම් නිලධාරී තැනට ලැබෙනසේ එවිය යුතුයි.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 බැගින් ගෙවනු ලැබේ.

3. අයදුම්කරුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) අයදුම්කරු ඉහතකී ජාඇල-දඹුගම් පේරුව ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) (i) 1925 සිට 1944 කාලයෙහි සිංහල පාඨශාලා හැරයාමේ සහතිකපත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතික පත්‍ර විභාග යෙන් සමත්වීම හෝ,

(ii) සිංහල භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ එයට උසස් විභාගයකින් සමත්වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද, අයදුම්පත් භාර ගනු නොලැබේ.

6. අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම්පත් ලේඛනගත තැපැලෙන් එවිය යුතුය.

ඩ. වි. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දිසාපති කාර්යාලයේ දීය.

### ආදර්ශ අයදුම් පත්‍රය

## කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ " ඒ " ජාඇල-දඹුගම් පේරුවේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය සමග පැහැදිලි අකුරෙන්)
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම්පත් භාරගන්නා දිනට සම්පූර්ණ වයස :————.
(ආ) උපන් දිනය සහ ස්ථානය :————.
5. විවාහක අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කළේද ? එසේනම් ඒ පිළිබඳ විස්තර : ————.
9. තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයත්, විස්තර සහිතව :————.
10. අයදුම්කරු ණයගැතිව සිටිද ? එසේනම් ඒ පිළිබඳ විස්තර : ————.
11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණය මගින් දඬුවම් ලබා තිබේද ?
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–66—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## කොළඹ දිස්ත්‍රික්කයේ නුගෙනහිර සියනෑ කෝරළේ උඩුගහපත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරය

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරළේ උඩුගහ පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කරමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරනු ලද අයදුම්පත් 1970 ඔක්තෝබර් මස 10 වැනි දිනට පෙර නිට්ටඹුව, නැගෙනහිර සියනෑ කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනට ලැබෙනසේ එවිය යුතුයි.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 බැගින් ගෙවනු ලැබේ.

3. අයදුම්කරුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) අයදුම්කරු ඉහතකී නැගෙනහිර සියනෑ කෝරළේ උඩුගහ පත්තු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) (i) 1925 සිට 1944 කාලයෙහි සිංහල පාඨශාලා භාරයාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා භාරයාමේ විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්වීම, හෝ

(ii) සිංහල භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ එයට උසස් විභාගය කින් සමත්වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද, අයදුම්පත් භාරගනු නොලැබේ.

6. අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

ඩ. පී. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දිසාපති කාර්යාලයේ දීය.

ආදර්ශ අයදුම් පත්‍රය

### කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරළේ උඩුගහ පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය සමග පැහැදිලි අකුරෙන්)
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම්පත් භාරගන්නා දිනට සම්පූර්ණ වයස :————.
(ආ) උපන් දිනය සහ ස්ථානය :————.
5. විවාහක අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
9. තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයන්, විස්තර සහිතව :————.
10. අයදුම්කරු ණයගැතිව සිටිද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.
11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණය මගින් දඬුවම් ලබා තිබේද ? :————.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9-63—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ "බී" වැලිසර-මහබාගේ සුළු නගර සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ "බී" වැලිසර-මහබාගේ සුළු නගර සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කරමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1970 ඔක්තෝබර් 10 වැනි දිනට පෙර වත්තල, දකුණු අළුත්කුරු කෝරළේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනට ලැබෙනසේ එවිය යුතුයි.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 බැගින් ගෙවනු ලැබේ.

3. අයදුම්කරුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) අයදුම්කරු ඉහතකී වැලිසර-මහබාගේ සුළු නගර සහා ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) (i) 1925 සිට 1944 කාලයෙහි සිංහල පාඨශාලා භාරයාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා භාරයාමේ විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්වීම, හෝ

(ii) සිංහල භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ එයට උසස් විභාගය කින් සමත්වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද, අයදුම්පත් භාරගනු නොලැබේ.

6. අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

ඩ. පී. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දිසාපති කාර්යාලයේ දීය.

ආදර්ශ අයදුම් පත්‍රය

### කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ "බී" වැලිසර මහබාගේ සුළු නගර සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය සමග පැහැදිලි අකුරෙන්)
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම්පත් භාරගන්නා දිනට සම්පූර්ණ වයස :————.
(ආ) උපන් දිනය සහ ස්ථානය :————.
5. විවාහක අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
9. තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයන්, විස්තර සහිතව :————.
10. අයදුම්කරු ණයගැතිව සිටිද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.
11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණය මගින් දඬුවම් ලබා තිබේද ? :————.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9-80—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ "ඒ" රාගම-බටුවත්ත ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය

කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරලේ "ඒ" රාගම-බටුවත්ත ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරණ ලෙස මෙයින් ආරාධනා කරමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1970 ඔක්තෝබර් 10 වැනි දිනට පෙර ජා-ඇල, දකුණු අළුත්කුරු කෝරලේ "ඒ" ප්‍රාදේශීය ආදායම් නිලධාරී තැනට ලැබෙනසේ එවිය යුතුයි.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 බැගින් ගෙවනු ලැබේ.

3. අයදුම්කරුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම.

(ඇ) අයදුම්කරු ඉහතකී රාගම-බටුවත්ත ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) (i) 1925 සිට 1944 කාලයෙහි සිංහල පාඨශාලා හැරයාමේ සහතිකපත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්වීම හෝ,

(ii) සිංහල භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ එයට උසස් විභාගයකින් සමත්වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධූරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද, අයදුම්පත් භාරගනු නොලැබේ.

6. අයදුම්පත් ලැබුණ බවට දැන්වීමක් කරණු නොලැබේ. අයදුම්පත් ලේඛණගත තැපෑලෙන් එවිය යුතුය.

ඩ. වී. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දිසාපති කායාීලයේ දීය.

### ආදර්ශ අයදුම් පත්‍රය

### කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ "ඒ" රාගම-බටුවත්ත ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය සමග පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම්පත් භාරගන්නා දිනට සම්පූර්ණ වයස :————.
(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරණ රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද ? එසේනම් ඒ පිළිබඳ විස්තර : ————.

9. තමන් සතු දේ පොළවල වටිනාකම සහ ප්‍රමාණයන්, විස්තර සහිතව :————.

10. අයදුම්කරු ණයගැතිව සිටීද එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණය මඟින් දඬුවම් ලබා තිබේද ? :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–65—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ:—

සහකාර සංස්කාරක (සිංහල/ඉංග්‍රීසි)—I/II ශ්‍රේණි —

**සුදුසුකම්**

(අ) පිළිගත් ප්‍රවෘත්ති පත්‍රයක සංස්කාරක මණ්ඩලයේ හෝ ගුවන් විදුලි ආයතනයක ප්‍රවෘත්ති කාර්ය මණ්ඩලයේ හෝ අඩු වශයෙන් තුන්වසක පළපුරුද්ද සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ; හෝ

පිළිගත් ප්‍රවෘත්ති පත්‍රයක සංස්කාරක මණ්ඩලයේ හෝ ගුවන් විදුලි ආයතනයක ප්‍රවෘත්ති කාර්ය මණ්ඩලයේ හෝ අඩු වශයෙන් පස් වසක පළපුරුද්ද සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක මධ්‍ය පරීක්ෂණය හෝ ඊට සමාන විභාගයක් ; හෝ

ගුවන් විදුලි ආයතනයක දසවසක පළපුරුද්ද ඇති වාර්තාකරුවන් හා

(ආ) සේවාවට අදාළ භාෂාව පිළිබඳ පුළුල් දැනුමක්. අනෙකුත් භාෂා පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(ඇ) ස්වදේශීය හා විදේශීය තත්කාලීන සිදුවීම් පිළිබඳ දැනුම.

**වැටුප් ක්‍රමය**

I ශ්‍රේණිය—රු. 625—900 (25 × 5—30 × 5) රු. 750 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

II ශ්‍රේණිය—රු. 525—825 (20 × 5—25 × 8) රු. 625 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

**වයස**

අවුරුදු 25—45 දක්වා.

මේ සමග ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව සැපයිය යුතු අයදුම්පත් 1970 සැප්තැම්බර් මස 18 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර ගැලපෙන පරිදි ''සහකාර සංස්කාරක (සිංහල/ඉංග්‍රීසි) I/II ශ්‍රේණිය'' යන්න සඳහන් කළ යුතුයි.

සුසිල් මුණසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.

1970 අගෝස්තු මස 26 වැනි දින,
කොළඹ 7.

### නිදර්ශන අයදුම්පත

————තනතුර සඳහා වූ අයදුම් පතයි

1. සම්පූර්ණ නම :————.
(1) මුල් අකුරු සහිත නම :————.
(මහත්මයාද, මහත්මියද, මෙනෙවියද යනවග සඳහන් කරන්න)
(2) ලිපිනය :————.

2. උපන් දිනය හා ස්ථානය :————.
(1) 1970 සැප්තැම්බර් 18 වැනි දිනට වයස : අවු. :————.
මාස :————. දින :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

3. ජාතිය :————.

4. අධ්‍යාපන හා පුහුණුවීම් :—

| ඉගෙනීම ලැබූ පාසැල් හා ආයතන | දින ...... සිට ...... දක්වා | සමත්වී ඇති විභාග | දැරූ වගකිවයුතු තත්ත්ව හා යෙදුණු වැදගත් පරිබාහිර කටයුතු |
|---|---|---|---|
| | | | |

5. සමත්වී ඇති උසස්ම විභාගය :—
(1) සිංහල :————.
(2) දෙමළ :————.
(3) ඉංග්‍රීසි :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

6. පළපුරුද්ද :————.
(ඔබගේ අතීත පළපුරුදුකම් හා රැකියා පිළිබඳ වාර්තා කාල ක්‍රමානුගතව යොදන්න.)

(iii) ගිණුම් නමැති 1 වන ප්‍රශ්න පත්‍රයත්, රෙගුලාසි, කාර්ය සංවිධානය සහ කාර්යාල ක්‍රම නමැති 2 වන ප්‍රශ්නයත් යන දෙකට මැ සිංහල හෝ දෙමළ හෝ භාෂා මාධ්‍යයෙන් උත්තර ලියන අපේක්ෂකයෝ, සිංහල නොහොත් දෙමළ නමැති 3 වන ප්‍රශ්න පත්‍රයෙන් නිදහස් කරනු ලබත්.

(iv) මතු සඳහන් සුදුසුකම් කිසිවක් ලබා සිටින අපේක්ෂකයෝ ද, සිංහල නොහොත් දෙමළ විෂයයෙන් නිදහස් කරනු ලැබීමට නිස්සෝ වෙත්.

සිංහලෙන් නිදහස් කිරීම :

(අ) මහා භාණ්ඩාගාරයේ සිංහල ප්‍රවීණතා විභාගයේ ඉහළ පෙළින් එගොඩ වී සිටීම,

(ආ) (සිංහල) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය.

(ඉ) සිංහල භාෂාව හෝ නවීන සිංහල හෝ ශාස්ත්‍රීය සිංහල හෝ විෂයයක් හැටියට ඇති (ඉංග්‍රීසි) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය.

(ඊ) (සාමාන්‍ය පෙළ) ලංකා පොදු අධ්‍යයන සහතික විභාගයේ ඒ නොහොත් බී නිර්දේශයේ සිංහල භාෂාව.

(උ) 1964 මාර්තු 23 වන දා අංක 640 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ කියැවෙන සිංහල ප්‍රවීණතා විභාගයේ IV වන ශ්‍රේණියෙන් එගොඩ වී සිටීම.

දෙමළෙන් නිදහස් කිරීම :

(අ) මහා භාණ්ඩාගාරයේ දෙමළ ප්‍රවීණතා විභාගයේ ඉහළ පෙළින් එගොඩ වී සිටීම,

(ආ) (දෙමළ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය,

(ඉ) දෙමළ භාෂාව විෂයයක් හැටියට ඇති (ඉංග්‍රීසි) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය.

(ඊ) (සාමාන්‍ය පෙළ) ලංකා පොදු අධ්‍යයන සහතික විභාගයේ ඒ නොහොත් බී නිර්දේශයේ දෙමළ භාෂාව.

9. විභාගයේ කාල සටහන මෙසේ වනු ඇත :—

පෙරවරු 9.00-11.00 රෝහල් පාලනය පිළිබඳ රෙගුලාසි, කාර්ය සංවිධානය, කාර්යාල ක්‍රම.

පස්වරු 1.00-2.30 ගිණුම්.

පස්වරු 2.45-4.15 සිංහල/දෙමළ.

සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය, වේලාව, ඉසව්ව, ඊට සුදුසුකම් ලබන සියලු අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් විසින් වෙන මැ දන්වා එවනු ඇත.

ජී. අමරසේන,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට,
(පාලන) නියෝජ්‍ය අධ්‍යක්ෂ.

1970 අගෝස්තු මස 28 වැනිදා,
කොළඹ,
තැ. පෙ. අංක 500 හිමි
මහලේකම් පාරේ
සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දී ය.

අයැදුම් පතේ සැලැස්ම

(කාර්යාලයයේ වැඩට පමණි)
....................................
....................................
....................................

## ආරෝග්‍යශාලා ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ II වන ශ්‍රේණියට ඉහළ නැංවීමේ විභාගය

1. ඔබේ පුරුදු අත්සන :————.

(ඔබ අත්සන් කළ යුත්තේ අත්සන සහතික කරන අය ඉදිරිපිට යැ.)

(අ) නම් සියල්ල එ හැම පිටින් :————.
(පැහැදිලි වටකුරු අකුරෙන්)

(ආ) දැනට දරන ප්‍රත්වීම :————.

(ඉ) කාර්යාලීය ලිපිනය :————.

2. උපන් දිනය :————.

3. ඔබ ලක් වැසියෙක් ද යන වගත්, සිංහල, ලංකා දෙමළ, බර්ගර් යනාදි වශයෙන් දක්වන්න :————.

4. (i) ආරෝග්‍යශාලා ලිපිකාර සේවයේ සාමාන්‍ය ලිපිකාර පන්තියට බැඳුණු දිනය :————.

(ii) 1968 ඔක්තෝබර් 1 වන දාට ආරෝග්‍යශාලා ලිපිකාර සේවයේ පිරෙන අවුරුදු ගණන :————.

(iii) ඔබේ පත්වීම තහවුරු වී තිබේද :————.

(iv) (අ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අභිප්‍රායයට ඔබ නව ප්‍රවේශකයෙකුද නැත්නම් ආදි ප්‍රවේශකයෙකුද යන වග : ————.

(ආ) ඔබ ආරෝග්‍යශාලා ලිපිකාර සේවයට බඳවා ගන්නා ලද්දේ කිනම් භාෂා මාධ්‍යයකින් ද ?

5. දැන්වීමේ 8 (3) ඡේදය යටතේ ඔබ ගන්නා විෂය—සිංහල නොහොත් දෙමළ—නම් කරන්න :————.

6. ඔබ සිංහල/දෙමළ විෂයයෙන් නිදහස් කරනු ලැබීමට නිස්සෙකු නම්, එසේ නිදහස් වන්නේ මේ දැන්වීමේ 8 වන ඡේදයේ එන කැලැකියේ (iii) න් ද නැත්නම් (iv) න් ද යන වග දක්වන්න. (iv) වන කැලැකිය යටතේ නම් මතු සඳහන් තොරතුරු දක්වන්න :————.

(අ) විභාගයේ නම :————.

(ආ) විභාගයේ අවුරුද්ද, මාසය :————.

(ඉ) විභාග අංකය :————.

(ඊ) සිංහලෙන්/දෙමළෙන් සමත් විෂය :————.

(උ) සිංහල/දෙමළ ප්‍රවීණතා විභාගයේ මාධ්‍යය සහ ශ්‍රේණිය නොහොත් පෙළ :————.

විමධ්‍යගත කොට්ඨාශ ප්‍රධානයාගේ සහතිකය

(i) මේ නිලධාරියා, ආරෝග්‍යශාලා ලිපිකාර සේවයේ සාමාන්‍ය ලිපිකාර පන්තියේ ලිපිකරුවෙකු බව ත්, 1970............... .............වන දා, ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ දැන්වීම ප්‍රකාර අත්දමට මේ විභාගයට පෙනී සිටීමට ඔහු නිස්සෙකු බව ත්, ඔහුගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්,

(ii) අයැදුම් පතේ 4 වන, 6 වන, කොටුවලැ දී තිබෙන තොරතුරු විමසා බලනු ලැබ හරි බව පෙනී ගිය බවත්

මෙයින් සහතික කරමි.

විමධ්‍යගත කොට්ඨාශ ප්‍රධානයාගේ

අත්සන :————.

පදවිය :————.

දිනය :————.

අත්සන සහතික කිරීම—

අයැදුම්කරුගේ අත්සන සහ දිනය :————.

සැලකිය.—අයැදුම්කරු අත්සන් කළ යුත්තේ තම විමධ්‍යගත කොට්ඨාස ප්‍රධානියා හෝ, ඔහු වෙනුවට අත්සන් කිරීමට වරම් ලත් වෙන යම් නිලධාරියෙකු හෝ, ඔහුගේ ප්‍රාදේශීය ප්‍රධානියා හෝ ඉදිරි පිටැ දී යැ.

මාගේ කාර්යාලයයේ නිලධාරියෙකු වන, මා හොඳින් දන්නා අයෙකු වූද ...............................මහතා 1970 ක් වූ ................. මස......වන අද දින මා ඉදිරිපිටැ තම අත්සන තැබූ බව මෙයින් සහතික කරමි.

අත්සන සහතික කරන අයගේ අත්සන :————.

නම, පදවිය සහ තරාතිරම :————.

ලිපිනය :————.

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාව විභාග ශාලාධිපතීන්ට දැන්විය යුතු ය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක් වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තබන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන හැම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසිය දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කරලා ඇත්තේ පරීක්ෂකවරායගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවලට අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධ ව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගණන් බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊලඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූවිට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකුගේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නො දිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතු ය.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

විභාග දෙපාර්තමේන්තුවේ දීය.

9–220—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## 1969 නොවැම්බර් මස පැවැත්වූ ආරෝග්‍යශාලා ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ II වන ශ්‍රේණියට නිලධාරීන් උසස් කිරීමේ විභාගය

1969 නොවැම්බර් මස 22 වෙනි දින පවත්වන ලද ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව, පහත නම් සඳහන් අපේක්ෂකයින්, කුශලතාවය අනුපිළිවෙලට, ආරෝග්‍යශාලා ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ II වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා තෝරා ගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| නම | | සේවා ස්ථානය |
|---|---|---|
| 1. ආරුමුගම්, වී. | ... | සෞඛ්‍ය සේවා අධිකාරි කායාර්ලය, මඩකලපුව. |
| 2. අබේසිංහ, ආර්. | ... | රජයේ රෝහල, කෑගල්ල. |
| 3. යසවර්ධන, ඒ. ඩී. කේ. | ... | මහ රෝහල, රත්නපුර. |
| 4. මැන්දිස්, බී. ආර්. පී. | ... | ක්ෂය රෝග මර්ධන ව්‍යාපාර අධිකාරි කායාර්ලය, කොළඹ 12. |
| 5. බන්දුසේන, ඒ. ටී. | ... | රජයේ රෝහල, වැලිගම. |
| 6. මානවඩු, එම්. | ... | රජයේ රෝහල, ගාල්ල. |
| 7. පෙරේරා, එම්. ඒ. එස්. ඒ. | ... | රජයේ රෝහල, කෑගල්ල. |
| 8. ජයතිලක, එස්. එම්. ඩී. ජේ. | | රජයේ රෝහල, කුලියාපිටිය. |
| 9. ලයනල්, කේ. ඩබ්. | ... | මුදල් ශාඛාව, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, කොළඹ. |
| 10. ගුණවර්ධන, ජේ. එස්. | ... | මහ රෝහල, කොළඹ. |
| 11. සිල්වා, ඩී. පී. | ... | මහ රෝහල, කොළඹ. |
| 12. වඩුතන්ත්‍රි, ආර්. ද එස්. | ... | රජයේ රෝහල, පිදිගම. |
| 13. සාමිනාතර්, ජී. | ... | ද සොයිසා කාන්තා රෝහල, කොළඹ. |
| 14. කිරිදිවත්ත, එච්. බී. | ... | රජයේ රෝහල, බගවන්තලාව. |
| 15. දිසානායක, ඩී. | ... | මහ රෝහල, බදුල්ල. |
| 16. මණ්ඩාවල, ජේ. | ... | මහ රෝහල, මහනුවර. |
| 17. පැස්කුවල්, සී. | ... | රජයේ රෝහල, කෑගල්ල. |
| 18. වීරසිංහ, එච්. එම්. එස්. | ... | මහ රෝහල, රත්නපුර. |
| 19. පියසේන, බී. ඒ. | ... | මහ රෝහල, මහනුවර. |
| 20. විජයසිංහ, ඒ. පී. | ... | උතුරු කොළඹ මහ රෝහල, රාගම. |
| 21. සිල්වා, පී. එල්. සී. බී. | ... | ක්ෂය රෝග මර්ධන ව්‍යාපාර අධිකාරී කායාර්ලය, කොළඹ. |
| 22. අමරසේන, එම්. ජී. බී. | ... | සෞඛ්‍ය සේවා අධිකාරී කායාර්ලය, ගාල්ල. |
| 23. සුගතපාල, කේ. පී. | ... | මහ රෝහල, රත්නපුර. |
| 24. විලියම්, ඒ. | ... | මහ රෝහල, බදුල්ල. |
| 25. ජයසිංහ, ජේ. එම්. ඩී. ටී. | ... | රජයේ රෝහල, හොරණ. |
| 26. යෝගානන්දවෙල්, වී. | ... | රජයේ රෝහල, අනුරාධපුර. |
| 27. කුලරත්න, එම්. පී. | ... | මහ රෝහල, කොළඹ. |
| 28. සෙම්බුකුට්ටිගේ, ඒ. එස්. | ... | රජයේ රෝහල, මාතර. |
| 29. දෙද්දුව, කේ. | ... | රජයේ රෝහල, පුණ්ඩුගල. |
| 30. එදිරිවීර, සී. | ... | මුදල් අංශය, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, කොළඹ. |
| 31. ප්‍රේමරත්න, ජී. | ... | රජයේ රෝහල, හොරණ. |
| 32. වර්සකෝන්, ඩබ්. | ... | රජයේ රෝහල, දැරණියගල. |
| 33. රත්නායක, ඩී. ඩබ්. | ... | දකුණු කොළඹ මහ රෝහල, කළුබෝවිල. |
| 34. ආරියපාල, බී. ජී. එම්. | ... | මහ රෝහල, කොළඹ. |
| 35. අබයකෝන්, ඩබ්. ඩී. | ... | සෞඛ්‍ය සේවා අධිකාරි කායාර්ලය, බදුල්ල. |
| 36. ද අල්විස්, ඩබ්. ඩී. | ... | මහ රෝහල, රත්නපුර. |
| 37. ගුණසේකර, බී. එල්. සී. | ... | සෞඛ්‍ය සේවා අධිකාරි කායාර්ලය, කොළඹ. |
| 38. ජයවර්ධන, කේ. සී. | ... | මහ රෝහල, කොළඹ. |
| 39. නන්දසේන, එම්. ඩී. | ... | ඇස් රෝහල, කොළඹ. |
| 40. ප්‍රේමසිරි, ජේ. ඒ. | ... | ක්ෂය රෝග මර්ධන ව්‍යාපාර අධිකාරී කාර්යාලය, කොළඹ. |

ජී. අමරසේන,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1970 අගෝස්තු මස 26 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

9–152—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2.) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. පිඩන ලාම්පු සැපයීම් ... | 1970.10.24. |
| 2. කුණාවූ ලන්තෑරුම හා අමතර ඒමිනි සැපයීම | 1970.10.24. |

ටෙන්ඩර්පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ,ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝරම් කොළ ලබාගෙන ටෙන්ඩර්පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝරම් කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970.9.4 දින,
කොළඹදීය.

9–219—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### අරක්කු සහ වෙනත් දේ ප්‍රවාහනය සඳහා ටෙන්ඩර්—මහනුවර 1970/71

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ—

(i) මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි සුරාබදු ගුදම් සහ දුම්රිය බඩු ගබඩාව අතරද,

(ii) මහනුවර දිස්ත්‍රික්කය තුළ හා දිවයිනේ වෙනත් පෙදෙස්වල පිහිටි එනම්, යාපනය, වවුනියාව, මඩකලපුව සහ ත්‍රිකුණාමලය සුරාබදු ගුදම් අතර හා ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ ස්කාගාර අතර ද,

අරක්කු හා වෙනත් දේ එහා මෙහා ප්‍රවාහනය සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 1 හේමාස් ගොඩනැගිල්ලේ 1 වැනි මහලේ පිහිටි සුරාබදු දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 සැප්තැම්බර් මස 18 වන දින පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ.

රුපියල් 100ක මුදලක් සුරාබදු දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග සුරාබදු කොමසාරිස් වෙතින් ඉල්ලුම්කළ විට ලබාගත හැකි ටෙන්ඩර් ෆෝරමයක මෙම ටෙන්ඩර් සකස් කළයුතු අතර, මේ පිළිබඳ අවශ්‍ය සියලුම විස්තර සුරාබදු කොමසාරිස්ගෙන් නොමිලයේ ලබාගත හැකිය. ටෙන්ඩර් පත්‍ර 1970 සැප්තැම්බර් 17 වන දින දහවල් 12න් පසුව නිකුත් කරනු නොලැබේ.

මු. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

1970 අගෝස්තු මස 28 වන දින,
කොළඹ 1,
හේමාස් ගොඩනැගිල්ලේ පළමුවැනි මහලේ,
සුරාබදු කොමසාරිස් කාර්යාලයේදීය.
එල්බී/ඩී/437

9–244—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## වැලිකඩ බන්ධනාගාර කර්මාන්ත අංශයේ සාදන ලද ගැලුමේ පින් විකිණීම 69/70

කොළඹ 9, වැලිකඩ බන්ධනාගාරයේ බන්ධනාගාර කර්මාන්ත අධිකාරී විසින් පින් තහඩුවලින් සාදන ලද ගැලුමේ හිස් පින් 1,000 විකිණීම සඳහා 1970 සැප්තැම්බර් 25 වැනි දින පූ. භා. 10 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්පත් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණි. ටෙන්ඩර් තැන්පත් මුදල රු. 25 කි. මෙම කාර්යාලයෙන් මුදල් භාර දෙන වවුචරයක් ලබාගෙන එයත් සමග බන්ධනාගාර මූලස්ථානයේ සරප් කාර්යාලයේ තැන්පත් කිරීමෙන් පසු ඒ සඳහා නිකුත් කරනු ලබන රිසිට්පත් තමන් ඉදිරිපත් කරන ටෙන්ඩර්පතට ඈමිණිය යුතුයි. කොළඹින් පිට නම් ඕනෑම දිසාපති කාර්යාලයක එම මුදල් තැන්පත් කළ හැක.

3. යම් ටෙන්ඩරයක් බාරගත් බව ලිපියකින් දන්වා දින හතක් (7) ඇතුලතදී එම ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට නොහැකි වී නම් හෝ ඉවත් කර ගැනීමේ කාර්ය පැහැර හැරියේ නම් ටෙන්ඩර් පත් වෙනුවෙන් තැන්පත් කළ මුදල් රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඇතුලත් කරනු ලැබේ. ටෙන්ඩර්පත් පිළිගත් බවට දන්වා යැවෙන ලිපිය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට යැවීනි නම් හෝ එම ස්ථානයේ තබා ආවේ නම් හෝ ටෙන්ඩර්කරුට සිය ටෙන්ඩරය පිළිගත් බව දන්වා යැවුණු සේ සලකනු ලැබේ. පිළිගත් ටෙන්ඩර්කරු විසින් උක්ත ද්‍රව්‍ය ඉවත් කර ගැනීමෙන් පසු තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

4. ටෙන්ඩර්කරුවන් විසින් හිස් පින් සියල්ලක්ම වෙනුවෙන් ඒකාබද්ධ මිලක් සඳහන් කළ යුතුයි. වැඩිම මිලට පින් සියල්ලම දෙනු ලැබේ. ටෙන්ඩර්පත් ලියුම් කවරයක බහා සීල් තබා පහත සඳහන් අයගේ ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් හෝ පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක. සෑම ලියුම් කවරයකම වම්පස ඉහළ කෙළවරේ "ගැලුමේ හිස් පින් විකිණීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුයි. මේ සඳහා ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු නොලැබේ.

5. සාමාන්‍ය වැඩ කරන දිනයන්හි පූ. භා. 8 සිට පූ. භා. 11 දක්වාද අ. භා. 1 සිට 3 දක්වාද පෙර පෝ දිනයන්හි පූ. භා. 8 සිට 11 දක්වාද වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත කාර්යාලයෙන් විමසීමෙන් මෙම හිස් පින් පරීක්ෂා කළ හැක. ටෙන්ඩර්කරුවන්, විසින් ටෙන්ඩරයේ යම් මැකීමක් හෝ වෙනස් කිරීමක් කර තිබේ නම් එයට ඔවුන්ගේ අත්සන් තැබිය යුතුයි.

6. ටෙන්ඩර්පත් 1970 සැප්තැම්බර් 25 පූ. භා. 10.30 ට කොළඹ 9, වැලිකඩ බන්ධනාගාර කර්මාන්ත අධිකාරීගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන් විසින් අනුමත කරන නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ඉදිරිපත් විය හැක.

7. තවත් වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය නම් පහත අත්සන් කරන අයගෙන් ඒවා ලබා ගත හැක.

ඩබ්ලිව්. ජේ. ද සිල්වා,
වැඩ බලන බන්ධනාගාර කර්මාන්ත අධිකාරී.

බන්ධනාගාර කර්මාන්ත කාර්යාලය,
වැලිකඩ බන්ධනාගාරය,
කොළඹ 9,
1970 අගෝස්තු මස 24 වැනි දින.

9–110—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

**කොච්චිකඩේ අඟුරු මඩුවේ පිහිටි අංක 2 දරණ තේ කඩය**

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාල සීමාවකට යථෝක්ත තේ කඩය බදුදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1970. 9. 18 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝරමවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම ෆෝරම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1970. 9. 16 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් ෆෝරම සමග නිකුත් කරනු ඇත.

9–138—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මාතලේ උප කොට්ඨාශය

මධ්‍යම කොට්ඨාශය භාර නත්තරන්පොත කුණ්ඩසාලේ වාසී ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මාතලේ උප කොට්ඨාශය යටතේ වලකුඹුර අමුණ ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත් 1970 සැප්තැම්බර් මස 30 වෙනි බුද දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

2. මෙම දෙපාර්තමේන්තුවේ රු. 28,500 කට හෝ ඊට වැඩි ගණන කට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවනට, සමුපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

3. 1970 සැප්තැම්බර් මස 16 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 28 වෙනි දින දක්වා සාමාන්‍ය කායභාල වේලාවන්හිදී මාතලේ, මහනුවර, හසලක සහ නුවරඑළියේ උප කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරු කායභාලවලින් ලබාගත හැකි ෆෝරමවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් ෆෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද නැතිද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර මෙම වැඩය සඳහා රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග කායභාලවල හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම වැඩය සඳහා සියලු විස්තර කායභාලීය වේලාවන් තුළදී මාතලේ වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ කායභාලයේදී ලබාගත හැක.

එම්. සී. ඩී. වී. අපොන්සො,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මාතලේ උප කොටස.

1970. 8. 22 වන දින,
මාතලේ වාරිමාර්ග කායභාලයේදී ය.

9–149—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහියංගන උප කොට්ඨාශය

1970/'71 වර්ෂයේ මහියංගන උප කොට්ඨාශයේ ගබඩා ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් 1970 ඔක්තෝබර් මස 1 වෙනි බ්‍රහස්පතින්ද පෙරවරු 12 තෙක් බණ්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 75,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් කළ හැකිය.

3. මේ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන්ට යටත් පිරිසෙයින් ලොරි තුනක් තිබිය යුතු අතර, ඔවුන් විසින් ඒවායේ ලියාපදිංචි බලපත්‍ර හා මෙම වර්ෂයට ලබා ගත් වාහන බලපත්‍රයන්ද ඉදිරිපත් කළ යුතුය.

4. 1970 සැප්තැම්බර් මස 28 වෙනි සඳුදා දහවල් 12 දක්වා මහියංගන, බදුල්ල හෝ මොනරාගල වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් දෙපිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට ප්‍රථම රු. 100 ක තැන්පත් මුදලක් එම වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

5. මේ සම්බන්ධයෙන් ඕනෑම විස්තරයක් කාර්යාල වේලාවන් තුළදී මහියංගන වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

එස්. සිවලිංගම්,
වාරිමාර්ග ඉංජිනේරු,
මහියංගන උප කොට්ඨාශය.

1970 අගෝස්තු මස 22 වෙනි දින,
මහියංගන වාරිමාර්ග කායභාලයේ දී ය.

9–139—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**මහ ඉලුප්පල්ලම ට්‍රැක්ටර් මඩුවක් තැනීම**

මහ ඉලුප්පල්ලම ට්‍රැක්ටර් මඩුවක් තැනීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.10.1 වැනි දින ප. ව. 2.30 වන තුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කොළඹ 5, නාරාහේන්පිට, පලතුරු කමිහල පාරේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු අංශයේ උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි ෆෝරම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර්පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ද ලබාගත හැක.

3. ටෙන්ඩර්කරුවන් රුපියල් 30,000කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970.9.17 වෙනි දින සවස 4 දක්වා ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ:—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිල්ලක්,
(ආ) රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970.8.27 දින,
සිවිල් ඉංජිනේරු අංශය,
පලතුරු කමිහල පාර,
නාරාහේන්පිට,
කොළඹ 5.

9–233—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**පොලිතින්—සැපයීම**

1970-71 මුදල් වර්ෂය තුළදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට තලාකාර පොලිතින් සහ පොලිතින් මලු සැපයීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 70. 9. 27 දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ. වැඩි විස්තර සඳහා මෙම ගැසට් පත්‍රයේ පළවී ඇති ඉංග්‍රීසි දැන්වීම බලන්න.

ආර්. ඇල්. සී. ඉලංගකෝන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම ගොවිපල්).

1970 අගෝස්තු මස 22 වැනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

9–39—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

පිඑස් සී 2/70.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ස්වයංක්‍රීය බෙහෙත් විදින උපකරණ සැපයීම

පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන පරිදි ස්වයංක්‍රීය බෙහෙත් විදින උපකරණ සැපයීම සඳහා 1970 ඔක්තෝබර් මස 9 වැනි දින පූ. භා. 10 දක්වා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සභාපති තැන විසින් දේශීය නිෂ්පාදකයින්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් විසින් තමන් විසින්ම සකස් කළ ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් සම්පූර්ණ කොට කවරවල බහා මුද්‍රා තබා "ස්වයංක්‍රීය බෙහෙත් විදින උපකරණ සැපයීම පිණිස ටෙන්ඩර්පත්‍ර" යනුවෙන් කවරයේ වම් කෙළවර මුදුනේ සඳහන් කොට, කොළඹ 1, තැ. පෙ. 584, සෙලින්කෝ මන්දිරයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

3. ටෙන්ඩර්පත්‍ර, ඉහත 2 වැනි ඡේදයේ ලිපිනය සඳහන් ස්ථානයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ (ගිණුම් අංශයේ) තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීමට හෝ ලේඛනගත තැපෑලෙන් එවීමට පිළිවන. ලේඛන ගත තැපෑලෙන් එවීමට අකමැති ටෙන්ඩර්කරුවන් තමන් ම හෝ ඔහුගේ නියෝජිතයින් මගින් සැපයීම් විස්තර, නම සහ ලිපිනය සඳහන් මුද්‍රා සහිත කවරවල බහාලන ලද ටෙන්ඩර්පත්‍ර ඉහත 2 වැනි ඡේදයේ ලිපිනය සඳහන් ස්ථානයේ එවැනි ටෙන්ඩර් භාර ගැනීමට බලය ලත්, ප්‍රධාන ගණකාධිකාරී වෙත පුද්ගලිකව භාර දිය යුතුය. මුද්‍රා සහිත ටෙන්ඩරය භාර දෙන්නාට ඔහු විසින් ටෙන්ඩරය භාර ගත් බවට දැනුම් දීමේ කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

4. රුපියල් 100 ක මුදලක් කච්චේරියක (කොළඹ කච්චේරියේ) හෝ කොළඹ කිංස් පාරේ අංක 355 හි රජයේ බෙහෙත් ගබඩා අධිකාරි කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. මුදල් තැන්පත් කළ බවට ලද රිසිට් පත ටෙන්ඩරයට ඇමිණිය යුතුයි.

5. ටෙන්ඩර් භාර දීමෙන් පසු ටෙන්ඩර් අස් කර ගැනීමට ඔවුනට ඉඩ දෙනු නොලැබේ.

6. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හේතු නොදක්වා ඉවත දැමීමට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයට බලය ඇත. මෙම දැන්වීමෙ සඳහන් සියලුම කොන්දේසි සම්පූර්ණ ලෙස පිළිපැද නොමැති කිසිම ටෙන්ඩරයක් සලකා බලනු නොලැබේ.

7. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් නියමිත කාලසීමාව තුළදී කණ්නාඩි ස්වයංක්‍රීය බෙහෙත් විදින යන්ත්‍ර සැපයීමට අසමත් වුව හොත් ටෙන්ඩර් ඇපමුදල රාජසන්තක කරන අතර, වැඩිදුරටත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරණු පිණිස බලය ලත් නිලධාරි තැනට වාර්තා කරනු ලැබේ.

8. සියලුම ටෙන්ඩර්කරුවන්ට ඉහත 2 වැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී, නියමිත දින, නියමිත වේලාවට, ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් මෙන්ම ඉල්ලුම් කොට ඇති මිළ ගණන් ද පැමිණ ඇති ටෙන්ඩර් කරුවන්ට ප්‍රකාශ කරනවා ඇත. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී යම් ටෙන්ඩරයක් නිරීක්ෂණය කිරීම සඳහා ඉල්ලුම් කරන ටෙන්ඩර් කරුවෙකුට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙතින් පිළියෙල කොට ගත් අවස්ථාවකදී ඕනෑම ටෙන්ඩරයක අනු පිටපත නිරීක්ෂණය කිරීමට ඉඩ දෙනු ලැබේ.

එන්. කේ. පී. විජේසිංහම්.

9-239—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### 1969-70 වර්ෂය සඳහා පුස්තකාල පොත් සැපයීම

රජයේ පාසල් පුස්තකාලවලට පුස්තකාල පොත් සැපයීම සඳහා කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩල යෙහි සභාපති විසින් 1970 සැප්තැම්බර් මස 16 වැනි දින පෙරවරු 10 දක්වා මිළ ගණන් භාරගනු ලැබේ.

2. මිළ ගණන් විවෘත කරන වේලාවේදී එතැනට පැමිණ සිටීමට මිළ ගණන් එවූ සැපයීම්කරුවන්ට අවසර දෙනු ලැබේ. මිළ ගණන් පූර්වෝක්ත 1 වැනි ඡේදයෙහි සඳහන් වන දිනයෙහි එකී වේලාවට අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යාලයේදී විවෘත කෙරෙනු ඇත.

3. මිළ ගණන්, නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘති පත්‍ර 1970 සැප්තැම්බර් මස 14 වැනි දින පස්වරු 1 දක්වා කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගේ කාර්යාලයේදී ලබාගත හැකිය.

4. සෑම මිළ ගණනක්ම පිටපත් දෙකකින් යුක්තවිය යුතුය. මිළ ගණන් බහා එවන කවරයෙහි වම් පස මුදුන් කෙළවරේ "1969-70 වර්ෂය සඳහා පුස්තකාල පොත් සැපයීම සඳහා ඉදිරිපත් කෙරෙන මිළ ගණන්" යනුවෙන් සටහන් කළ යුතුය.

5. ලියාපදිංචි කළ තැපැල් මගින් ද මිළ ගණන් එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය සපයන්නෙක් ස්වකීය මිළ ගණන් මේ අයුරින් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම මිළ ගණන් මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයකු මගින් හෝ මිළ ගණන් පිළිගැනීමට හා ඒවා ලැබුණු බව දැන්වීමට බලය දී සිටින අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාරදීමට වුවද හැකිය. (එබඳු අවස්ථාවන්හිදී පූර්වෝක්ත 4 වෙනි ඡේදයෙහි සඳහන්වූ විස්තර ද සැපයුම්කරුගේ නම හා ලිපිනය ද, මිළ ගණන් බහා එවන කවරයේ සඳහන් කළ යුතුය).

6. මිළ ගණන් එවීම සඳහා ආකෘති පත්‍ර ලබාගැනීමට පළමුව තැන්පත් මුදලක් වශයෙන් රු. 100 ක් කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ගෙවීම් ශාඛාවෙහි හෝ කොළඹින් පිට සැපයුම්කරුවන් විසින් කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. සැම්පල, නියමිත පරිදි ඉදිරිපත් කළ යුතුය.

8. කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගෙන් ඉල්ලුම් කොට මේ පිළිබඳ වැඩිදුර විස්තර හා කොන්දේසි ද දැනගත හැකිය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්.

1970 අගෝස්තු මස 28 වැනි දින,<br>
කොළඹ 2, මැලේ වීදියේ,<br>
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

9-224—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුව—හලාවත

### 1970-71 මුදල් වර්ෂය ඇතුළත හලාවත අධ්‍යාපන ප්‍රදේශයේ පාසල්වලට "ඇදිහැස" බිස්කෝතු ප්‍රවාහණය කිරීම

මෙහි පහත සඳහන් සේවාවන් සඳහා සිල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(1) පහත දක්වෙන සැපයීම් මධ්‍යස්ථානවල සිට එහි දක්වෙන මණ්ඩලවලට අයත් සියළුම පාසල්වලට පෙට්ටිවල අසුරන ලද "ඇදිහැස" බිස්කෝතු ප්‍රවාහණය කිරීම :—

| සැපයීම් මධ්‍යස්ථානය | මණ්ඩලය |
| --- | --- |
| මාදම්පෙ | (1) හලාවත (2) වෙන්නප්පුව (3) නාත්තන්ඩිය (4) බිංගිරිය (5) උඩුබද්දාව |
| පුත්තලම | (1) පුත්තලම (2) ආණමඩුව |
| මහව | (1) නිකවැරටිය. |

2. ඉහත සඳහන් එක් එක් මණ්ඩලය සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කල යුතුය. බිස්කෝතු ප්‍රවාහනය පිළිබඳ ටෙන්ඩර් පත් හලාවත අධ්‍යාපන කාර්යාලයයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1970 සැප්තැම්බර් මස 25 වැනි දින පෙ. ව. 10 තෙක් භාරගනු ලැබේ. එදිනම පෙ. ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කිරීමේදී සෑම ටෙන්ඩර්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ඇත. හලාවත අධ්‍යාපන කාර්යාලයයෙන් ලබාගත හැකි නියමිත ආකෘතිපත්‍ර මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් ආකෘතිපත් ලබා ගැනීමට පෙර. රු. 100 ක තැන්පත් මුදලක් එක් එක් මණ්ඩලය වෙනුවෙන් හලාවත අධ්‍යාපන කාර්යාලයයේ ගණකාධිකාරී වෙත තැන්පත් කොට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට 1970 සැප්තැම්බර් මස 23 දින පෙ. ව. 12 වන තෙක් ටෙන්ඩර් ආකෘතිපත් නිකුත් කරනු ලැබේ. අනුමත සමිතියක් නම් එකී මුදල තැන්පත් කිරීම අනවශ්‍යය.

4. ටෙන්ඩර් පෝරම නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාරදීම අපේක්ෂා කරන අයවලුන් විසින් හලාවත අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රුපියල් 10,000 ක් වටිනා ස්ථිර දේපොල ඇති බවට ඒත්තු යන පරිදි සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. බිස්කෝතු ප්‍රවාහනය කිරීමට අදහස් කරනා මණ්ඩල ගණන දෙකකට වැඩි නම් ලොරි දෙකක් ද, මණ්ඩල ගණන දෙකකට අඩු නම් එක් ලොරියක් ද ඉල්ලුම් කරුට තිබිය යුතුය. එකී වාහන ඉල්ලුම්කරුගේ නමින් 1970 වර්ෂයට ලියාපදිංචි කරන ලද බවට බලපත්‍රය ඉදිරිපත් කල යුතුය. අනුමත කරන ලද සමුපකාර, ග්‍රාමසංවර්ධන, කම්කරු සමිති, මගින් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට කලින්, හලාවත අධ්‍යාපන අධ්‍යක්ෂ

හපුතලේ සැපයීම මධ්‍යස්ථානයේ සිට :—

(3) හපුතලේ සහ වැලිමඩ මණ්ඩලය.

2. බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගෙන් ලබා ගත් නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රවල ඉල්ලුම් කළ යුතුයි. බණ්ඩාරවෙල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රු. 100 ක් තැන්පත් කර ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් 1970 සැප්තැම්බර් මස 17 වනදා දහවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැක. අනුමත කරන ලද සමිති විසින් ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම අනවශ්‍යයි.

3. ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් 1970 සැප්තැම්බර් මස 18 වැනි දින පෙරවරු 10.30 ට බණ්ඩාරවෙල අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එහි සිටීමට ඉඩ දෙනු ලැබේ.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර, ටෙන්ඩර් බාරදීමට බලාපොරොත්තු වන අය තමා සතුව රු. 10,000 කට නොඅඩු වටිනාකම් ඇති නිශ්චල දේපොල ඇති බවට, තම ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරි තැනගෙන් මෑතකදී ලබාගත් සහතිකයක් ද, ඉල්ලුම්කරු නමින් ලියාපදිංචි කරන ලද මේ වර්ෂයට වලංගු බලපත්‍ර ඇති ලොරියක්, දෙකක් වත් ඇති බවට සැහෙන සාක්ෂිද, බණ්ඩාරවෙල අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

5. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමුපකාර සමිති විසින් ටෙන්ඩර් ආකෘති පත් ලබාගැනීමට පෙර, එකී සමිතියට මෙම සේවාව ඉටුකිරීමට හැකියාවක් ඇති ලොරි සේවයක් ඇති බවට, සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්ගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂගෙන් හෝ කම්කරු කොමසාරිස්ගෙන් හෝ ලබා ගත් සහතිකයක්, බණ්ඩාරවෙල අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් සම්පූර්ණයෙන්ම බාරගැනීමට හෝ එහි කොටසක් පමණක් බාරගැනීමට බලය, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සතුවේ. ටෙන්ඩර් පත් බාරගැනීම අවසන් කළ දින සිට සති 6ක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් විවෘතව තැබීමට ටෙන්ඩර්කරුවන් එකඟ විය යුතුය.

7. අමතර විස්තර සඳහා බණ්ඩාරවෙල අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් විමසන්න.

ඩී. අබේසේකර,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,
බණ්ඩාරවෙල.

1970 අගෝස්තු මස 25 දින,
බන්ඩාරවෙල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදිය.

9-140—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### 1970 ඔක්තෝබර් 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කළුතර දිස්ත්‍රික්කයේ පාසල්වලට "ඇදිහැස" කිරි විස්කෝතු ගෙන යාම

මෙහි පහත දැක්වෙන සේවාවන් සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(අ) මැලිබන් සහ ලංකා විස්කෝතු සමාගම්වල සිට පහත දැක්වෙන අධ්‍යාපනික මණ්ඩලයන්හි පාසල්වලටද,

(ආ) මැලිබන් සහ ලංකා විස්කෝතු සමාගම්වල සිට කළුතර ගබඩාවලටද,

(ඇ) කළුතර ගබඩාවල සිට පහත දැක්වෙන අධ්‍යාපනික මණ්ඩලයන්හි පිහිටි පාසල් වෙතටද, රාත්තල් විස්සකට ආසන්න කිරි විස්කෝතු සහ කඩදාසි පෙට්ටි ප්‍රවාහණය කිරීම, (නියමිත වශයෙන් "අ" හි සේවය ක්‍රියාත්මක වේ. "ආ" හි සහ "ඇ" හි සේවාවන් නියම කරනු ලබන්නේ, අවශ්‍ය වුවහොත් පමණකි.)

ඉහත සඳහන් කරන ලද අධ්‍යාපනික මණ්ඩල මෙසේ ය :—

1. අගලවත්ත උතුර.
2. අගලවත්ත දකුණ.
3. කළුතර.
4. පානදුර.
5. බණ්ඩාරගම.
6. බුලත්සිංහල.
7. බේරුවල.
8. මතුගම.
9. හොරණ.

ඉහත "අ", "ආ" සහ "ඇ" හි සඳහන් සේවයන් සඳහා ටෙන්ඩර් පත්‍ර, කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1970 සැප්තැම්බර් මස 25 වැනි දින පෙරවරු 10 දක්වා භාර ගනු ලැබේ. මෙම කාර්යාලයෙන් ලබා ගත යුතු නියමිත ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු වේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පෙර රුපියල් සියයක (රු. 100) තැන්පත් මුදලක් මෙම කාර්යාලයේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත් අයට 1970 සැප්තැම්බර් මස 20 වැනි දින පෙරවරු 11.30 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද මෙහි පහතින් කියැවෙන සමිති එකී මුදල තැන්පත් කිරීම අනවශ්‍යය.

ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අපේක්ෂා කරන අය විසින් රුපියල් දහ දාහක් (රු. 10,000) වටිනා දේපොළ තමා සතුව ඇති බවට ඒ න්තු යන පරිදි සහතිකයක් ලබාගෙන කළුතර, ප්‍රාදේශීය අධ්‍යාපනාධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති සහ කම්කරු සමිති මගින් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට කලින්, සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාගෙන් හෝ කම්කරු කොමසාරිස්තුමාගෙන් හෝ එකී සමිතියට මෙම සේවය ඉටු කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් යථායොග්‍ය පරිදි ලබා ගෙන කළුතර, ප්‍රාදේශීය අධ්‍යාපනාධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

මණ්ඩල දෙකකට වැඩි සංඛ්‍යාවකට ටෙන්ඩර් ඉදිරිපත් කරන්නේ නම්, ඉල්ලුම්කරුගේ නමට ලියාපදිංචි කරන ලද, 1970 වර්ෂය සඳහා බලපත්‍ර ලබාගත් ලොරි දෙකක්වත් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. මූලික අවශ්‍යතාවය ඉහත කී පරිදි ලොරි දෙකක් වන අතර, ප්‍රවාහණය භාර ගන්නා මණ්ඩල ගණන අනුවත්, ඒ ඒ මණ්ඩලවල ගමනාගමන පහසුකම් අනුවත්, අතිරේකව පාවිච්චි කළ යුතු ලොරි ගණන ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලැබේ. තවද, කළුතර ප්‍රදේශයේ හැර වෙනත් ප්‍රදේශවල කිරි විස්කෝතු බෙදා හැරීම භාර ගෙන තිබේ නම්, එවැනි අයවලුන් වෙත තිබිය යුතු ලොරි සංඛ්‍යාව ගැනද අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සෑහීමකට පත් විය යුතුය.

කළුතර, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ "ඇදිහැස" සංවිධානයෙන් හෝ නිකුත් කිරීමේ ඇණවුම් පත් හෝ වෙනත් නියමයන් හෝ ලැබී සතියක් ඇතුළත පාසල්වලට විස්කෝතු ගෙන ගොස් භාර දීම කළ යුතුවේ. ටෙන්ඩරයක් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමේ හෝ එහි කොටසක් පමණක් භාර ගැනීමේ හෝ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. ටෙන්ඩර් අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිබඳ අවසාන තීරණය සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක් කල් දිය යුතුය. ටෙන්ඩරය පිළිබඳ සියලුම කොන්දේසි හා වෙනත් විස්තර කළුතර, ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ පරිපාලන නිලධාරිවරයාගෙන් ලබා ගත හැකිය.

වී. වීරවර්ධන,
කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 අගෝස්තු මස 26 වැනි දින,
කළුතර,
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

9-141—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—කුරුණෑගල

### කුරුණෑගල අධ්‍යාපන ප්‍රදේශයේ පාසැල්වලට "ඇදිහැස" කිරි විස්කෝතු ප්‍රවාහණය කිරීම

1970.10.1 සිට 1971.9.30 දක්වා කාලය තුළ මෙහි පහත දක්වෙන සේවාවන් සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.9.25 වැනි දින පෙරවරු 10 තෙක් බාරගනු ලැබේ.

කුරුණෑගල හා මහව රජයේ ගබඩාවල සිට කාඩ්බෝඩ් පෙට්ටිවල අසුරන ලද විස්කෝතු පහත දැක්වෙන මණ්ඩලයන්හි පිහිටි රජයේ පාසැල් වෙත ගෙන ගොස් විදුහල්පතීන්ට භාරදීම.

සඳහන් කරන ලද පාසැල් මණ්ඩල මෙපරිදිය :—

(1) කුරුණෑගල.
(2) පොල්ගහවෙල.
(3) මාවතගම.
(4) වාරියපොල (1).
(5) වාරියපොල (2) (හෙට්ටිපොල ප්‍රදේශය).
(6) දොඩන්ගස්ලන්ද.
(7) දඹදෙණිය.
(8) කුලියාපිටිය.
(9) කටුගම්පොල.

ටෙන්ඩර්කරුවන්, මෙම ප්‍රදේශයේ සේවාවන් සඳහා සම්පූර්ණයෙන් ම මිඩංගු කළ හැකි අවශ්‍ය වාහන සංඛ්‍යාව ඇති අය විය යුතු ය. අවශ්‍ය වූ විට, අමතර ලොරි මේ සේවාවන් සඳහා යෙදීමට ටෙන්ඩර හිමි වූවන් සූදානම් ව සිටිය යුතු ය.

5. ටෙන්ඩර්පත්‍ර සැපයීමේ මධ්‍යස්ථානයේ සිට පාසල් කරා විස්කෝතු ප්‍රවාහණය කොට භාරදීම සඳහා විය යුතු ය. සැපයීමේ මධ්‍යස්ථානයේ දී පෙට්ටි පැටවීම එම මධ්‍යස්ථානයේ කම්කරුවන් විසින් කරනු ලැබේ.

6. කිසියම් ටෙන්ඩර්පත්‍රයක් මුළුමණින් හෝ කොටස් වශයෙන් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් තමා වෙත ම තබා ගනු ලැබේ. ටෙන්ඩර් භාර ගෙන අවසන් වූ තැන් පටන්, සති හයක් දක්වා කාලයක් මුදල් ලේ තම ටෙන්ඩරය භාරගනු ලැබීද නැද්ද යන්න ගැන දැන්වීමක් බලාපොරොත්තුවෙන් සිටිය යුතු ය.

7. විස්කෝතු ප්‍රවාහණය කොට පාසල්වලට භාර දීම සතියක් ඇතුළත සම්පූර්ණ කළයුතු බව ටෙන්ඩර්කරුවන් සිහියේ තබා ගත යුතු ය.

8. පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන්ගේ සේවය යථාපරිදි කල් ඇතිව දැනුම් දෙනු ලැබ කවර හෝ අවස්ථාවක උතුරු ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂතැනගේ අයිමතය පරිදි නතර කිරීමට ඉඩ තිබේ.

9. වැඩිදුර විස්තර හා තොරතුරු අවශ්‍ය වෙතොත් යාපනයේ, උතුරු ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙන් ඉල්ලා සිටින්න.

වී. සංකරලිංගම්,
උතුරු ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
යාපනය, 1970 අගෝස්තු 26.

9–177—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### කොළඹ දකුණ ප්‍රදේශයේ පාසැල්වලට කිරි විස්කෝතු ගෙනයාම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම

මෙහි පහත දැක්වෙන සේවය සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

මැලිබන් හා ලංකා විස්කෝතු සමාගමේ විස්කෝතු නිෂ්පාදන ස්ථානවල සිට රාත්තල් 20 පෙට්ටිවල අසුරන ලද විස්කෝතු පහත දැක්වෙන මණ්ඩලයන්හි පිහිටි පාසැල් වෙත ප්‍රවාහනය කිරීම :—

| | |
|---|---|
| 1. මැද කොළඹ | 7. කොලොන්නාව |
| 2. උතුරු කොළඹ | 8. කොට්ටාව |
| 3. දකුණු කොළඹ | 9. හෝමාගම |
| 4. දෙහිවල-ගල්කිස්ස | 10. අවිස්සාවේල්ල |
| 5. මොරටුව | 11. කැස්බෑව |
| 6. කෝට්ටේ | 12. බොරැල්ල |

ඉහත සඳහන් මණ්ඩල සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ 7, ග්‍රීන් පාත්හි දකුණු කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 1970 සැප්තැම්බර් 18 වැනි දින පෙරවරු 10.30 තෙක් භාරගනු ලැබේ.

කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි නියමිත ආකෘතිපත්‍ර මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු වේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පෙර රු. 100 ක තැන්පත් මුදලක් කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත් අයට 1970 සැප්තැම්බර් මස 17 වැනි දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද සමිතියක් නම්, එකී මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය.

ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාරදීම අපේක්ෂා කරන අයවලුන් විසින් කොළඹ 7, ග්‍රීන්පාත්හි ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රුපියල් 10,000ක් වටිනා ස්ථිර දේපල ඇති බවට ඒත්තු යන පරිදි, ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිගෙන් සහතිකයක් හා මණ්ඩල දෙකකට වැඩි සංඛ්‍යාවකට ටෙන්ඩර් ගාස්තු ඉදිරිපත් කරන්නේ නම්, ඉල්ලුම්කරුගේ නමට ලියාපදිංචි කරන ලද 1970 වර්ෂයේ බලපත්‍ර ලබා ගත් ලොරි දෙකක්වත් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. මූලික අවශ්‍යතාවය ඉහත කී පරිදි ලොරි දෙකක් වන අතර, ප්‍රවාහණය භාර ගන්නා මණ්ඩල ගණන අනුවත්, ඒ මණ්ඩලවල ගමනාගමන පහසුකම් අනුවත්, අතිරේකව පාවිච්චි කළ යුතු ලොරි ගණන ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තීරණය කළ යුතු වේ. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමිති මගින් ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමට පෙර කොළඹ 7, ග්‍රීන් පාත්හි අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමාගෙන් හෝ කම්කරු කොමසාරිස්තුමාගෙන් එකී සමිතියට මෙම සේවය ඉටු කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් යථායෝග්‍ය පරිදි ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකළ අයට ෆෝර්ම නිකුත් කරනු නො ලැබේ.

කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ඇදිහැස සංවිධානයෙන් හෝ නිකුත් කිරීමේ ඇනවුම් පත් ලැබී පාසල පවත්නා දින 7ක් ඇතුළත පාසැල්වලට විස්කෝතු ගෙන ගොස් භාර දීම නිම කළ යුතු වේ. ටෙන්ඩරයක් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම හෝ එහි කොටසක් පමණක් භාර ගැනීමේ හෝ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. ටෙන්ඩර් අපේක්ෂකයින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිබඳ අවසාන තීරණය සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක් කල් දිය යුතුය. ටෙන්ඩර් පිළිබඳ සියලුම කොන්දේසි හා වෙනත් විස්තර කොළඹ, ග්‍රීන් පාත්හි, ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලන නිලධාරිගෙන් ලබා ගත හැකිය.

ඩී. ජී. සුගතදාස,
කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 සැප්තැම්බර් මස 4 වැනි දින,
කොළඹ 7, ග්‍රීන් පාත්හි,
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

9–223—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### පාවිච්චි කරන ලද ටයර් විකිණීම—අපහරණ අංගනය, වේරහැර, බොරලැස්ගමුව

බොරලැස්ගමුවේ, වේරහැර ලංකා ගමනා ගමන මණ්ඩලයේ අපහරණ අංගනයේ තිබෙන පහත සඳහන් ප්‍රමාණයන් ගෙන් යුක්ත වූ පාවිච්චි කරන් ලද ටයර් මිලදී ගෙන හැරගෙන යාම සඳහා එළින සීල් තැබූ ටෙන්ඩර් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970. 9. [illegible] වෙනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ :—

(ඒ) නැවත පිරවිය හැකි ටයර—3,700 යි.

(බී) පාවිච්චි කර ඉවත් කරන ලද ටයර—7,600 යි.

මිශ්‍ර ප්‍රමාණයන් ගෙන් එක් තොගයකට 100 බැගින් වූ මෙම ටයර් වලට තොග අංකයන්ද සඳහන් කර ඇත.

ටෙන්ඩර් බාර ගැනීමේ නියමිත අවසාන දිනට පෙර දින දහවල් 12 වන තුරු ටෙන්ඩර් ෆෝර්ම වේරහැර බොරලැස්ගමුවේ පිහිටි ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. ඒවා පිටපත් දෙකකින් යුක්ත කොට එවිය යුතුය. ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලබන්නේ එක් තොගයකට රු. 50 බැගින් වූ උපරිම වශයෙන් රු. 2,500 දක්වා මුදලක් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලං. ග. ම. ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය මගේ කාර්යාලයට ඉදිරිපත් කළ විටය.

මේ ටයර කාර්යාලීය වේලාවලදී වේරහැර අපහරණ අංගනයේදී පරීක්ෂාකර බැලිය හැකිය.

වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන.

සම්පාදක කොට්ඨාශය,
වේරහැර, බොරලැස්ගමුව.

9–208—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

යොමු අංකය සීඩී/23/70.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ රෝහල් මණ්ඩලය

### කොළඹ රෝහල් මණ්ඩලයේ ආයතනවල ඉඳුල් කෑම විකිණීම

1970.10.1 වන දින සිට 1971.9.30 වන දින දක්වා වූ මුදල් වර්ෂය තුළ මෙහි සඳහන් උපලේඛනයේ දැක්වෙන රෝහල්වල මුළුතැන්ගෙවල බැහැර ලන ඉඳුල් කෑම මිලදී ගෙන යැම සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර්පත් ලාංකිකයන්ගෙන් හෝ ලාංකික ආයතනවලින් 1970 සැප්තැම්බර් මස 27 වන දින පෙරවරු 10 වනතුරු කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරිතුමා විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේදී එක් එක් ආයතනය (අංශය) සඳහන් වෙන් වෙන් වශයෙන් මාසික මිල ගණන් සඳහන් කළ ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් එවිය යුතු අතර එය බහා ලන කවරයේ වම් කෙළවරේ උඩ " ඉවත ලන ඉඳුල් කෑම විකිණීම " යනුවෙන් සඳහන් කළ යුතුය. කවරය තුළ බහා සීල් තබන ලද සෑම ටෙන්ඩර් පත්‍රයක්ම මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීමෙන් හෝ මා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් 1970 සැප්තැම්බර් මස 27 වන දින පෙරවරු 10ට පෙර මා වෙත ලැබෙන්න සැලැස්විය යුතුය.

3. ඉදිරිපත් කරනු ලබන සෑම ටෙන්ඩර් පත්‍රයක්ම 1970.9.27 වන දින පෙරවරු 10 ට කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරිතුමාගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

4. මේ ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති සියලු දෙනාටම පැමිණ සිටිය හැක. පැමිණ සිටින අයගේ දැනගැනීම සඳහා නම් හා මිල ගණන් කියවනු ලැබේ.

5. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ආයතනයන්වල ඉඳුල් කෑම දිනපතා ඉවත ගෙන යන බවට හා එම සේවාවන් හරියාකාරව ඉටු කරන බවට ගිවිසුමකට බැඳිය යුතු අතර, ඒ උපලේඛනයේ දැක්වෙන පරිදි ඇපයක්ද තැබිය යුතුව ඇත. මේ ඇප මුදල කොන්ත්‍රාත්තුව අවසානයේදී කොන්ත්‍රාත්කරුට ආපසු ගෙවනු ලැබේ.

6. මේ ආයතනවල ඉවත ලන ඉඳුල් කෑම සඳහා කරනු ලබන මාසික ගෙවීම් ගාස්තු ඒ මාසයේ 1 වන සේවා දිනයේ දහවල් 12 ට පෙර ගෙවිය යුතුය.

7. මහ රෝහලේ ඉඳුල් ආහාර කොටස් තුනකට බෙදා ඇත.

(අ) මුළුතැන්ගෙවල ඉඳුල් කෑම,

(ආ) වාට්ටුවලින් ඉවත ලන ඉඳුල් කෑම ආදිය,

(ඇ) කොළඹ හෙදි විදුහලේ මුළුතැන්ගෙවල ඉඳුල් කෑම යනාදි වශයෙන්.

8. මේ පිළිබඳ වැඩි විස්තර මෙම කාර්යාලයෙන් ලබා ගත හැක.

ඒ. නාගේන්ද්‍රන්,
කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී.

1970 අගෝස්තු 24 දින,
කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී කාර්යාලයේ,
මුදල් අංශයේදී ය.

### උපලේඛනය

| ආයතනය | | ඇප මුදල රු. | ශ. |
|---|---|---|---|
| (1) කාසල් වීදියේ කාන්තා රෝහල, කොළඹ | ... | 50 | 0 |
| (2) ද සොයිසා කාන්තා රෝහල, කොළඹ | ... | 50 | 0 |
| (3) ළමා රෝහල, කොළඹ ... | ... | 50 | 0 |
| (4) නයනා රෝහල, කොළඹ ... | ... | 50 | 0 |
| (5) රෝගෝපසම නිවාසය, තලගොල්ල, රාගම | ... | 25 | 0 |
| (6) මහ රෝහල— | | | |
| (අ) මුළුතැන්ගෙවල ඉඳුල් ආහාර | ... | 100 | 0 |
| (ආ) වාට්ටුවලින් ඉවත ලන ඉඳුල් ආහාර ආදිය | ... | 100 | 0 |
| (ඇ) කොළඹ හෙදි විදුහලේ ඉවත ලන ඉඳුල් ආහාර | | 50 | 0 |

9-117—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොහු කෙඳි වර්ණ කිරීම සඳහා සුදුසු සායම් සහ රසායන ද්‍රව්‍ය ලබාගැනීම සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1970 සැප්තැම්බර් මස 25 වෙනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

සම්පූර්ණ විස්තර සඳහා සහ ටෙන්ඩර්පත්‍ර ලබාගැනීම සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විමසන්න.

එස්. ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 2/4/3/149
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1, 1970 අගෝස්තු මස 27 දා.

9-238—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

1970 ඔක්තෝබර් 1 දින සිට 1971 සැප්තැම්බර් 30 වැනි දින දක්වා කාලය තුළදී අම්බලන්ගොඩ, මාදම්පේ කාර්මික බඩු ගබඩාවේ සිට 10,00,000ක් පමණ ලුණු ලදා, අම්බලන්ගොඩ දුම්රිය ස්ථානයට පටවා ගෙනයෑමේ භාරදීම සඳහා ටෙන්ඩර්පත්‍ර 1970.9.25 වෙනි දින පෙ. ව. 10 දක්වා මා විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘතිපත්‍ර සහ වෙනත් විස්තර කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලෙහි පිහිටි කුඩා කර්මාන්ත අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයෙන් හෝ ගාල්ල කච්චේරියේ සිටින ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂතුමාගෙන් හෝ අම්බලන්ගොඩ මාදම්පේ කාර්මික බඩු ගබඩාවෙන් හෝ ලබාගත හැකිය.

එස්. ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 2/4/3/14

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1, 1970 අගෝස්තු මස 27 දා.

9-236—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ එලිසබෙත් රැජින තටාකයේ නැව්පත් පරීක්ෂා සඳහන් බඩු 1970 සැප්තැම්බර් මස 14 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1970 සැප්තැම්බර් මස 13 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂාකර බැලීමට පිළිවන :—

සෝඩා ඇෂ් මළු 500 ක්.

මෙම වෙන්දේසියෙන් මිලයට ගත් නෑ බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

එස්. ඒ. සත්සෝනී,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඩී/විකිණීම්/32.
1970 අගෝස්තු මස 28 දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේදී ය.

9-222—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ අංක 9 සහ 10 ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1970 සැප්තැම්බර් මස 11 වෙනි දින පෙ. ව. 10ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1970 සැප්තැම්බර් මස 10 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොයියහොත් ඒ බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

එස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඕ'විකිණීම්/31.
1970 අගෝස්තු මස 28 දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේදී ය.

1. පාවිච්චි කළ ඇඳුම් මලු 1 යි
2. එම
3. එම
4. එම
5. එම
6. එම
7. එම
8. එම
9. එම
10. පාවිච්චි කළ ඇඳුම් මලු 1 යි
11. එම
12. උණුසුම් තුවා මලු 1 යි (පාවිච්චි කළ)
13. පාවිච්චි කළ ඇඳුම් මලු 1 යි
14. සහ 14ඒ. පාවිච්චි කළ ඇඳුම් මලු 2 යි
15. පාවිච්චි කළ ඇඳුම් මලු 1 යි
16. විවිධ බඩු මලු 1 යි
17. පුද්ගලික භාණ්ඩ ට්‍රන්ක් පෙට්ටි 1 යි
18. යතුරු දඹවැල් පෙට්ටි 1 යි
19. ස්පැනර්ස් පෙට්ටි 1 යි
20. මෝටර් රථ වියුබ් කාටුන් 1 යි
21. මහණ යන්ත්‍ර උඛ කොටස් 1 යි (කැඩී ඇත)
22. පැන් දර්ශන පෙට්ටි 1 යි (කැඩී ඇත)
23. පැඩ්ලොක්ස් පෙට්ටි 1 යි
24. මුරිච්චි ඇණ මලු 1 යි
25. වෙල්ඩින් පුලුක්ස් මලු 1 යි
31. ට්‍රැක්ටර් කොටස් මලු 1 යි
32. සරනේරු සහ ඇණ මලු 1 යි
33. ඇණ (ජනේල්) මලු 1 යි
34. පිත්තල පොලිෂ් මලු 1 යි
35. මෝටර් කාර් අමතර කොටස් මලු 1 යි
36. ස්පිල් පේස්ට් බෝතල් 24 යි
37. නූල් මලු 1 යි
38. විවිධ බඩු මලු 1 යි
39. නූල් මලු 1 යි
40. මැලියම් කබදාසි මලු 1 යි
41. ප්‍රචාරක සඟරා මලු 1 යි
42. එම
43. නෙස්ටෝමෝල්ට් මලු 1 යි
44. වැලිකබදාසි මලු 1 යි
45. මෝටර් රථ සහ ට්‍රැක්ටර් කොටස් මලු 1 යි
46. විවිධ බඩු මලු 1 යි
47. පොත් සහ සඟරා මලු 1 යි
48. රබර් පෙන්ඩර්ස් මලු 1 යි
49. සරනේරු (සූට්කේස්) මලු 1 යි
50. කුඩ රෙදි මලු 1 යි
52. උණු වතුර බෝතල් (මූඩිය රහිත)
53. ඇමෝනියා මලු 75 යි
54. යන්ත්‍ර කොටස් පෙට්ටි 1 යි
55. යකඩ පසිප්ප තැලි 2 යි
56. ඇසිඞ් භාජන 2 යි (හිස් ඒවා 1 යි)
57. ඇස්බැස්ටෝස් පසිප්ප තැලි 3 යි
58. ට්‍රැක්ටර් කොටස් පෙට්ටි 9 යි
59. යකඩ තැලි 1 යි.

9–221—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

මෙහි පහත සඳහන් අබලන්වූ බඩු 1970 සැප්තැම්බර් මස 7 වෙනි දින, ගම්පහ පොලිස් ස්ථාන භූමියේදී පෙ. ව. 9 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම භාණ්ඩයන් කාර්යාල වේලාවන්හි පරීක්ෂා කළ හැක. බඩු ගැණුම්කරුවන් විසින් ඉල්ලා මිලට ගත් බඩු, මුදල් ගෙවා එවෙලේම රැගෙන යා යුතුය.

වෙන්දේසියේ විකිණීමට ඇති බඩු

| | | | |
|---|---|---|---|
| (1) | කාකි හට කබා | ... ... | 48 |
| (2) | කාකි කැලෑ කබා | ... ... | 3 |
| (3) | කාකි දිග කලිසම් | ... ... | 1 |
| (4) | කාකි කොට කලිසම | ... ... | 60 |
| (5) | වැහි කබා | ... ... | 13 |
| (6) | ඇල තොප්පි | ... ... | 141 |
| (7) | සර්ජන් තොප්පි | ... ... | 2 |
| (8) | පො. ප. කැප් තොප්පි | ... ... | 1 |
| (9) | සපත්තු කුට්ටම් | ... ... | 245 |
| (10) | බූට්ස් සපත්තු කුට්ටම් | ... ... | 40 |
| (11) | කැන්වස් සපත්තු කුට්ටම් | ... ... | 2 |
| (12) | හම් පටි | ... ... | 16 |
| (13) | කාකි රෙදි පටි | ... ... | 1 |
| (14) | මේස් කුට්ටම් | ... ... | 24 |
| (15) | බනන පටි කුට්ටම් | ... ... | 31 |
| (16) | වැහිකබා පටි | ... ... | 4 |
| (17) | බුරුසු | ... ... | 22 |
| (18) | උණ්ඩ ඌර | ... ... | 13 |
| (19) | පිස්තෝල කොපු | ... ... | 2 |
| (20) | පිස්තෝල උණ්ඩ ඌර | ... ... | 2 |
| (21) | ඇඳුම් කට්ටල් පලස් | ... ... | 23 |
| (22) | ඇඳුම් කට්ටල් පෙට්ටි | ... ... | 7 |
| (23) | කොහු ඉදිරි | ... ... | 55 |
| (24) | මනින පටි | ... ... | 3 |
| (25) | හිස් ගැලුමේ ටින් | ... ... | 19 |
| (26) | හිස් ගැලුම් හතරේ ටින් | ... ... | 79 |
| (27) | ඉඩි යතුරු | ... ... | 12 |
| (28) | පාපැදි | ... ... | 9 |
| (29) | යකඩ ඇඳන් | ... ... | 28 |

සහකාර පොලිස් අධිකාරි, ගම්පහ.

9–135—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂන දෙපාර්තමේන්තුව—බස්නාහිර දිසාව

### දැව වෙන්දේසිය

තොග 7 කින් යුත් මිල්ල, ලියන්, අලුබෝ, පෙලෙන්, දෙල් සහ දියපර ඉරු ලී කැලි 530=ඝන අඩි 246.9, තොග 1 කින් යුත් දෙල්, පෙලෙන්, දුන් සහ මිල්ල කඳන් 11=ඝන අඩි 134.0, උදලු 20, ගැරුම් වට්ටි 9, ඉල්ලන් තුරු 10, කුඩා 15, ටින් 1, පොරෝ 4, කියත් 2 සහ බාල්දි 2 ක් බස්නාහිර දිසා වන නිලධාරි විසින් 1970. 9. 7 දින පෙරවරු 10 ට රත්නපුර අඩවි වන නිලධාරි කායාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දැව සහ ආයුධ අඩවි වන නිලධාරි කායාලයේ සහ කුරුවිට පොලිසියේ සහ කුරුවිට වන රක්ෂක භාරයේ ඇත.

වෙන්දේසියේ ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන හවතුන්හට ඒ ඒ තොග බලා සෑහීමකට පත්වන ලෙස දන්වා සිටිමි. වෙන්දේසිය පිළිබඳ වැඩි විස්තර බස්නාහිර දිසා වන නිලධාරිගෙන් හෝ රත්නපුර අඩවි වන නිලධාරිගෙන් හෝ ලබාගත හැක.

කේ. අරුල්වෙල්වම්,
දිසා වන නිලධාරි,
බස්නාහිර දිසාව.

දි. ව. නි. කායාලය,
රත්නපුර.

9–15—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### දව වෙන්දේසියේ විකිණීම

පුල්ලුමලේ අඩවියේ, අඩවි වන නිලධාරි කායකිල භූමියේ ඇති වන අපරාධවල අත් අඩංගුවට ගත් තේක්ක, හල්මිල්ල යන වර්ගයෙන් දව තොග නැගෙනහිර දිසා වන නිලධාරි විසින් පුල්ලුමලේ අඩවි වන නිලධාරි කාර්යාලයේදී, 1970. 9. 11 දින පෙරවරු 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන් දව වෙන්දේසි කිරීමට පෙර එම ස්ථානයේ ඇති දව පරීක්ෂාකර බලා සෑහීමකට පත්විය යුතුය.

වැඩි විස්තර සඳහා පුල්ලුමලේ අඩවි වන නිලධාරීයෙන් විමසන්න.

එස්. මුතයියා,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරි.

1970. 8. 11 දින,
මඩකලපුව,
දිසා වන කාර්යාලයේදීය.

9–14—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් නිල ඇඳුම් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

පහත සඳහන් පාවිච්චි කරණ ලද නිල ඇඳුම කොටස් වන බට කබා, කැලෑ කබා, කොට කලිසම්, වැහි කබා, හම් සපත්තු, බූට්ස් සපත්තු, මෙට්ට, හා තවත් බඩු රාශියක් 70. 9. 20 දින පෙරවරු 9 ට බදුල්ලේ පොලිස් ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනනු ලැබේ. මෙම බඩු පරීක්ෂා කිරීම මෙදින පෙරවරු 8 සිට පරීක්ෂා කල හැක. බඩු මිලට ගැණීමෙන් පසු මුදල් ගෙවා බඩු වහාම ඉවත් කර ගත යුතුයි.

එල්. සී. අබේසේකර,
පොලිස් අධිකාරී ඌව බදුල්ල.

9–64—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## පරණ නිල ඇඳුම්, සපත්තු, ගුදිර සහ වෙනත් බඩු වෙන්දේසියක්

වර්ෂ 1970 සැප්තැම්බර් මස 14 වෙනි දින පෙ. ව. 9 ට පරණ නිල ඇඳුම්, සපත්තු, ගුදිර සහ වෙනත් පාවිච්චි නොකළ හැකි බඩු මිරිහාන පොලිසිය අසල පිහිටි නුගේගොඩ දිස්ත්‍රික්කයේ ප්‍රධාන පොලිස් බඩු ගබඩාව අසලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියට පෙර දින එකී බඩු ගබඩාවේදී පරීක්ෂා කිරීමට ඉඩදෙනු ලැබේ. වෙන්දේසිය අවසානයේදී ලබාගත් බඩුවලට මුදල් ගෙවා එම බඩු ගෙන යාමට හැකිවේ.

පොලිස් අධිකාරී බස්නාහිර පළාත (මැද),
නුගේගොඩ.

1970.8.26,
පොලිස් කායසිලය,
නුගේගොඩ.

9–147—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## වෙන්දේසියේ විකිණීමයි

1970 සැප්තැම්බර් මස 19 වෙනි දින සවස 1.30 ට ගාල්ල මහේස්ත්‍රාත් උසාවියේදී පහත සඳහන් බයිසිකල් සහ කොටස් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහේස්ත්‍රාත්, ගාල්ල.

1970 අගෝස්තු මස 19 වන දින,
ගාල්ල මහේස්ත්‍රාත් උසාවියේ දිය.

### බයිසිකල් අංක

| | | |
|---|---|---|
| 121758 | 67081 | 10 |
| KD 2750 | OL 2938 | 85563 |
| X 2055 | 932 OL | 10818 |
| EB 79266 | B 58370 | AN 98015 |
| B 11636 | BV 97044 | 3776 AK |
| D 966137 | BN 88812 | DK 90021 |
| H 80064 | CJ 98460 | DK 29697 |
| 9074 | J 9358 | KB 6548 |
| 10668 | AR 53552 | BT 6431 |
| 7849 | EF 83779 | 21799 |
| 65154 | JA 2221 | CH 72098 |
| W 3315 | Z 22819 | 27122 |
| H 19073 | 58 | G 315815 |
| IB 49438 | 36874 | CI 1182 |
| VZ 1166 | GK 1013 | 47225 |
| J 16522 | BD 39917 | FF 83102 |

| | | |
|---|---|---|
| B 884280 | GS 6258 | 33059 CC |
| 53342 | DP 15347 | 92961 |
| FD 73367 | TA 4342 | DK 30708 |
| AD 58486 | DD 18662 | DX 1791 |
| DL 53681 | BF 59950 | 19381 |
| DE 64479 | DL 78007 | AD 10193 |
| OK 1646 | CJ 2956 | X 73072 |
| DJ 2219 | C 2459 | AE 2199 |
| CO 24025 | CD 52216 | CO 2025 |
| AG 59172 | FG 6224 | GB 8131 |
| BH 9715 | 69225 | L 4112 |
| CV 2632 | BO 35099 | E 70979 |
| HX 3798 | BG 0493 | 102406 |
| GK 16149 | DG 92566 | DJ 74547 |
| K 13045 | 36457 | 707 |
| AL 62451 | SL 00611 | AY 4940 |
| 90575 | 1246 | AN 6842 |
| FE 86225 | CK 67112 | H 2554 |
| 42040 | BE 49092 | |

### බයිසිකල් රාමු අංක

17343
71870
941123
71494
DC 1
RS 12667
57466

9–9—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## කළුතර දිස්ත්‍රික්කයේ ඇල රේන්ද විකිණීම

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වෙනි දින තෙක් පහත සඳහන් ඇල වෙනුවෙන් රේන්ද ගාස්තු අය කිරීමේ හා එකතු කිරීමේ තනි අයිතිවාසිකම් මිලට ගැනීම සඳහා කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් කළුතර කච්චේරියේ දී 1970 සැප්තැම්බර් මස 23 වැනි දින පෙරවරු 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කැපූ ඇල පිහිටි කළුතර පුරාණ ඇල සහ මෝදර ඇල සහ ගල්තුඩේ පිහිටි ඇල එක් රේන්දපලක දී එකම දිනක් ඇතුලත රේන්ද ගාස්තු අය කිරීමෙන් අනිකුත් රේන්ද ගාස්තු ගෙවීම්වලින් නිදහස් වනු ඇත. (හතරමෝදර පිහිටි කළුතර අළුත් ඇල).

3. එක් එක් ටෙන්ඩර්පත්‍රය කවරයක බහා සීල්/මුද්‍රා තබා, ඒ කවරයේ ඉහළ වම් කෙළවරෙහි "කළුතර දිස්ත්‍රික්කයේ 1970/71 ඇල රේන්ද සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර 1970 සැප්තැම්බර් මස 23 වැනි දින පෙරවරු 10 ට කලින් කළුතර දිසාපති වෙත ලැබිය යුතුයි. එම වේලාවේ දී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර විවෘත කරන වේලාවේදී ටෙන්ඩර්කරුවන් කළුතර කච්චේරියට පැමිණ සිටිය යුතුයි.

4. පත්කරනු ලැබූ ටෙන්ඩර්කරු ඇලරේන්ද විකුණූ දිනයේ එනම්, 1970 සැප්තැම්බර් මස 23 වැනි දින ගැණුම් මුදලෙන් තුනෙන් පංගුවක් එවේලේම කච්චේරියෙහි මුදලින් තැන්පත් කොට රේන්ද විකුණුම් කොන්දේසි පත්‍රය අත්සන් කළ යුතුය.

5. රුපියල් 50 ක් තැන්පත් කළ බවට කච්චේරියකින් ලබාගත් කුවිතාන්සියක් එක් එක් ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතු බවද, පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා එයට නියමිත කොන්දේසි පත්‍ර අත්සන් නොකර රේන්දයට ගෙවිය යුතු ඉහත සඳහන් නියමිත ඇප මුදල එවේලේම කච්චේරියේ තැන්පත් කළ නොහැකි වුවහොත් ඔහු විසින් ටෙන්ඩර් පත්‍රය භාර ගැනීම සඳහා තැන්පත් කරන ලද රුපියල් 50 රාජසන්තක කිරීම සහ ඔහුට ඉන්පසු ආණ්ඩුවේ කොන්ත්‍රාත් ගැනීම අහිමි කිරීමට ක්‍රියා කරනු ලැබේ. පත් කරන ලද ටෙන්ඩර්කරු හිවිසුම් පත අත්සන් කළාට පසු තැන්පත් කළ රු. 50 ඒ ඒ ටෙන්ඩර්කරුවන්ට ආපසු ගෙවනු ලැබේ.

6. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති වෙත පැවරී ඇත.

7. මේ පිළිබඳ වැඩි විස්තර කළුතර කච්චේරියෙන් දැන ගත හැක.

එස්. ඩී. සී. සමරතුංග,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති.

1970 අගෝස්තු මස 24 වෙනි දින,
කළුතර දිසාපති කාර්යාලයේ දී ය.

9–107—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## මහනුවර දිස්ත්‍රික්කයේ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද නැවැත විකිණීම—1970–71

මහනුවර දිස්ත්‍රික්කයේ 1970–71 වර්ෂයේ විදේශීය තැබෑරුම් රේන්ද විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවමින් අංක 14,916 සහ 1970 ජූලි මස 24 වෙනි දින දරණ ගැසට් පත්‍රයේ මවිසින් පළ කළ දන්වීමේ සඳහන් කොන්දේසි සහ නියමයන් යටතේ පහත සඳහන් විදේශීය මත්පැන් තැබෑරුම්වල රේන්ද නැවත විකිණීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කරන දිනය හා වේලාවන් පහත දක්වේ.

| විදේශීය මත්පැන් තැබෑරුමේ අංකය හා නම | ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන දිනය හා වේලාව |
|---|---|
| අංක 2—ත්‍රිකුණාමල වීදිය ... | 1970 සැප්තැම්බර් මස 16 වෙනිද මධ්‍යාහ්න 12. |
| අංක 4—පුස්සැල්ලාව ... | 1970 සැප්තැම්බර් මස 16 වෙනිද පස්වරු 12.15 |
| අංක 7—දික්ඔය ... | 1970 සැප්තැම්බර් මස 16 වෙනිද පස්වරු 12.30 |

ඇස්. මාරලන්ද,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 අගෝස්තු මස 22 වෙනි දින,
මහනුවර කච්චේරියේ දීය.

9–111—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දන්වීම්

## වෙන්දේසියේ විකිණීමයි

රාගම තේවත්ත පාරේ පිහිටි නිදන කාමර දෙක සහ තුනෙන් යුත් මට්ටා යුගල නිවාස ක්‍රමය සහ ගොඩනැගිලි තැනීමට අනර්ඝ බිම් කැබලි—ජාතික නිවාස ආඥාපනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 401 වැනි පරිච්ඡේදය) අංක 76 දරණ මගන්තිය යටතේ හා 1966 අංක 36 දරණ (සංශෝධිත) පනත යටතේ විකිණීම

ජාතික නිවාස සහකාර කොමසාරිස් ඩබ්. එස්. වීරසිංහ මහතා විසින් මා වෙත විකිණීම සඳහා බලය පවරමින් නිකුත් කරන ලද 1967 නොවැම්බර් 15 දින දරණ නියෝගය ප්‍රකාර එකී නියෝගයෙහි උප ලේඛනයේ සඳහන් ඉඩම විකිණීම.

කොළඹ, ආර්. නාගලිංගම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 551 හා 1955 ජනවාරි 12 වෙනි දින දරණ උකස්කරය යටතේ, කොළඹ ආර්. සිවයෝගන් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 785 හා 1956 මාර්තු 21 දින දරණ දෙවන උකස්කරය යටතේ, කොළඹ එස්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 693 හා 1958 ජනවාරි 8 වන දින දරණ තෙවන උකස්කරය යටතේ සහ කොළඹ එස්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 691 හා 1958 ජනවාරි 8 සහ 10 දින දරණ අතිරේක ඔප්පු යටතේ රාගම, රාගම වලව්වේ ඒෆ්. ආර්. ද සොයිසා මහතාගෙන් 1967 පෙබරවාරි 28 දින තෙක් අය විය යුතු රුපියල් දාහත් ලක්ෂ විසි දෙදහස් එකසිය විසි තුනයි ශත තිහ (රු. 17,22,123.30) අයකර ගැනීම සඳහාත්, එසේම 67.2.28 දින සිට විකිණීම පැවැත්වෙන දින හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තවදුරටත් වූ රු. 12,02,629.54 ක මුදලක් සම්බන්ධයෙන් වන පොලී මුදල වර්ෂයකට හතර (4%) ප්‍රමාණයට යථෝක්ත උකස්කර ප්‍රකාර 1967.2.28 දින සිට විකිණීමේ දිනය තෙක් එකතු වන සියලුම දඩ මුදල් සමග අයකර ගැනීමත්, එසේ අය කර ගැනීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත් මෙහි පහත උප ලේඛණයේ සඳහන් ඉඩම 1970 සැප්තැම්බර් මස 28 වන සඳුදා (පෙර පෝය) සවස 4.30 සිට පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ රාගම පිහිටි උතුරින් තේවත්ත පාරෙන්ද, නැගෙනහිරින් බ්‍රිජට් ආබෘ මහත්මියට සහ වෝල්ටර් ගුණසේකරට අයත් ඉඩම්වලින්ද, දකුණින් හින්නගොඩ සහ පිට්ටනිය කුඹුර ග්‍රාම සීමාවෙන් සහ බටහිරින් සී 1 දරණ කැබැල්ලෙන්ද, මායිම් වූ කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් අංක බී. 404/31 යටතේ ලියාපදිංචි කරන ලද 1945 නොවැම්බර් 5 දින පී. ඒෆ්. ගුණසේකර බලයලත් මිනින්දෝරු තැන විසින් සකසන ලද අංක 2352 දරන මානක සැලැස්ම අනුව අක්කර දහනවයයි රූඩ් තුනයි පර්චස් තිහයි දශම පහයි බින්දුවක (අක්. 19, රූඩ් 3, පර්. 30.50) ප්‍රමාණයෙන් යුත් කැබැලි අංක ඒ වශයෙන් පෙන්නුම් කරන වෙරළුගහලන්ද නමැති ඉඩම සහ එහි තනා නිම නොකළ හා තනා නිම කළ නිවාස එක් කොටසක් සේ එකවර වෙන්දේසි කරනු ලැබේ.

පර්සි සහ සමාගමේ,
පී. එච්. විජේසිංහ,
(බලයලත් වෙන්දේසිකරු).

227, අළුත්කඩේ වීදිය,
කොළඹ 12,
දුර කථනය : 21983.

9–132—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දන්වීම්

## රේගු නිවේදනයයි

### ඌන ගොඩබෑම් හා ඌන මුදාහැරීම් සම්බන්ධ සහතිකපත් නිකුත් කිරීම

1970 සැප්තැම්බර් මාසයේ පසු පැමිණෙන නැව් සම්බන්ධ ඌන ගොඩබෑම් හා ඌන මුදාහැරීම් සහතික පත් මෙම දෙපාර්තමේන්තුව මගින් නොකෙරෙනු ඇති බව සියලු ආනයනකරුවන් හා රක්ෂණ සමාගම වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

භාණ්ඩයන්ගේ ඌන ගොඩබෑම් හා ඌන මුදාහැරීම් සම්බන්ධ තොරතුරු වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලයේ වාණිජ කලමනාකරුගෙන් ලබාගත යුතුය.

වී. පී. විට්ටාච්චි,
ප්‍රධාන රේගු අයකැමි.

මගේ අංකය : ඒඩී/1/70,
ලංකා රේගුව,
කොළඹ,
1970.8.21.

9–228—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දින වලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම් පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ රෙජිස්ට්‍රාර් මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | | ... | ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | | ... | ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | | ... | ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | | | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|---|---|---|
| එක් කොටසක් | ... | ... | ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් | | ... | ... | 43 50 | ... | 51 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | | | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් | ... | ... | ... | 0 50 | ... | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් | ... | ... | ... | 1 0 | .. | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 0 30 | ... | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 0 60 | ... | 0 15 |

දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි ... | 70. 6. 5 සිකුරාද ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද ... | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද ... | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද ... | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද ... | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු ... | 70. 8. 7 සිකුරාද ... | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද ... | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද ... | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද ... | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද ... | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද ... | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද ... | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද ... | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් ... | 70.10. 2 සිකුරාද ... | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද ... | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද ... | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද ... | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද ... | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් ... | 70.11. 5 බ්‍රහස්පතින්ද ... | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද ... | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද ... | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් ... | 70.12. 4 සිකුරාද ... | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද ... | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද ... | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද ... | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද ... | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී